# දායාද

අතීත අබිමන හෙටටත්

පුරාවිද්‍යා පුවත් අටුවාව

2014
ජූලි
අටවන කලාපය

පුරාවිද්‍යා
දෙපාර්තමේන්තුවේ
ප්‍රකාශනයකි

ජාතික උරුමයන් පිළිබඳ
අමාත්‍යාංශය


## ගොඩවාය සමුද්‍ර පුරාවිද්‍යා ගවේශනයෙන් මතුවන

# දකුණු ආසියාවේ පැරණිතම නාවුක කේන්ද්‍රස්ථානය...!



දකුණු ආසියාවේ පැරණිතම මුහුදු පුරාවිද්‍යා ස්ථානයට හිමිකම් කියනුයේ ශ්‍රී ලංකාවයි. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ හම්බන්තොට සහ අම්බලන්තොට අතර ඉපැරණි ගොඩවාය සමුද්‍ර තීරයේ එම ස්ථානය පිහිටියේය. එම ස්ථානය අළලා මෙතෙක් සිදුකර ඇති විද්‍යාත්මක පර්යේෂණයන්ගේ ප්‍රතිඵල අනුව අදින් වසර දෙදහස් දෙසීයක අතීතයට එහි ඉතිහාසය දිව යයි. ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සඳහන් පෙරඅපරදිග සේද මාවත පිළිබඳව මෙන්ම එවකට ජාත්‍යන්තර සබඳතා

4 වැනි පිටුවට....

### ත්‍රිකුණාමලය සමුද්‍ර හා නාවික ඉතිහාස කෞතුකාගාරය ජනතා අයිතියට පැවරේ

ත්‍රිකුණාමල ලන්දේසි නාවික කොමසාරිස් නිල නිවසෙහි පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු 2008 වසරේ දී ඇරඹුණු අතර, එහි සංරක්ෂණ කටයුතු අවසන් කර 2013 වසරේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් මහජන අයිතියට පැවරුණි. මෙම ගොඩනැගිල්ලේ කෞතුකාගාරයක් ස්ථාපිත කිරීමේ අරමුණින් එය සංරක්ෂණය කෙරුණු අතර සියලු අංගෝපාංගවලින් සමන්විත

4 වැනි පිටුවට....



### 2013 උරුම ප්‍රණාම ප්‍රසාද උළෙලේ දී පුරාවිද්‍යාඥයින් රැසකට සම්මාන ප්‍රදානය කෙරේ



මෙරට ජාතික උරුමයන් සුරක්ෂිත කරලීම උදෙසා සුවිශාල නිහඬ කාර්යභාරයක් ඉටුකළ සහ ඉටුකරමින් සිටින ලංකා පුත්‍රයින් ඇගැයීම වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වාර්ෂිකව සංවිධානය කරනු ලබන

18 වැනි පිටුවට....

### ලොව ප්‍රකට පුරාවිද්‍යාඥයෙකු වූ මහාචාර්ය රොබින් කනිංහැම් ශ්‍රී ලංකාවේ සංචාරයක....



එංගලන්තයේ ඩර්හැම් විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳව මහාචාර්යවරයෙකු වූ රොබින් කනිංහැම් මහතා පසුගියදා ශ්‍රී ලංකාවට පැමිණියේය.

18 වැනි පිටුවට....

ඇතුළත පිටු


උරුම රකින භික්ෂු — පිටුව 03
හඳුන්වා දෙන උරුමය — පිටුව 05
කුරගල ඉතිහාසය — පිටුව 09
ලාංකීය බුද්ධ ප්‍රතිමාව සහ එහි විවිධකරණය — පිටුව 20
ලිහිණිගල ගල්ගේ ප්‍රාථමික සිතුවම් — පිටුව 35
විදෙස් පුරාවිද්‍යා පාතු — පිටුව 38

හඳුන්වා දෙන උරුමය.





'හඳුන්වා දෙන උරුමය' තීරුව යටතේ මෙවර අපි නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශාන්තිමලේ ග්‍රාමසේවා වසමේ පිහිටි ඓතිහාසික බිම්කඩක් වූ පුළුකුණාව පිළිබඳ තොරතුරු සැකෙවින් ඉදිරිපත් කරමු. පසුගිය දිනෙක එම ස්ථානයේ සිදුකළ තොරතුරු ගවේෂණයකින් අනතුරුව මෙම විශේෂාංගය සැකසේ.

# පුළුකුණාව

මහියංගන-අම්පාර ප්‍රධාන මාර්ගයට නොදුරුව මෙම පුරාවිද්‍යා බිම්කඩ පිහිටා ඇත. අම්පාරේ සිට මහියංගන දෙසට කි.මී. 30 ක් පමණ ගමන් කළ පසු පුළුකුණාව හන්දිය හමුවෙයි. එතැන් සිට කි.මී. 3 ක් පමණ දුර අතුරු මාවතකි. මාර්ගය තාර අතුරා ඇත. එය පුළුකුණාව ගම්මානයට යන අතුරු පාරයි. ඓතිහාසික රජගලතැන්න පුරාවිද්‍යා භූමියේ සිට පුළුකුණාවට ඇත්තේ කි.මී. 10 පමණය.

වනරොදින් වැසීගත් විශාල කඳු පෙළකි. ඒ මේ අත විසිරුණු ගල්කුළු සමූහය විශේෂතා පරයා නැගී සිටී. එකක් අනිකට ආධාර වෙමින් ද තනිව එකක් හුදෙකලාව ද නැගී ගත් ගල්කුළු වෙත ළඟා වීමට බිඳුණු මාවතක් ඇත. සැම ගල්කුලක් වටා වැඩුණු විශාල ගස් සහිත ලඳු කැලෑවක. කඳු පෙළට දකුණෙන් කඳු පාමුල ඇති තැනිතලා ප්‍රදේශය පුරාම පැරණි ගොඩනැගිලි සමූහයක අවශේෂ විද්‍යමානය. මේ ගොඩනැගිලි අතර නිධන් හොරුන් විසින් විනාශ කළ දාගැබක නෂ්ටාවශේෂ ද ගල් කුළුණු සහිත ගොඩනැගිලි පාදම් ද සම්පූර්ණයෙන් ම පාෂාණ පිළී ගිය විශාල පොකුණක් ද දක්නට ලැබේ. දැනට ආසනඝරයක් ලෙස හඳුනාගෙන ඇති සුවිශාල නිර්මාණය ද පුරාවිද්‍යා භූමියේ ප්‍රවිශ්ටය සමීපයේම වෙයි.

ලඳු කැලෑව මැදින් වැටී ඇති කුඩා අඩි පාරේ කඳු මුදුන වෙත ගමන් ඇරඹුවෙමු. කොටිම්න් ලෙස ඒ මේ අත විසිරුණු ශෛලමය පියගැට පෙළ සමූහයකි. ස්වාභාවික ආපදාවන්ගේ (අව්ව, වැස්ස, සුළඟ ආදිය) නොනිමි සටනකට මුහුණ පා ඇති ඒ නෂ්ටාවශේෂ වැඩුණු ගස්කොළන් සහිත යටි කැලෑව විසින් ම රැකගෙන සිටී. තැන තැන විසිරුණු ගල් කුළුණු ද දැකිය හැකි ය. කන්ද මැදකට වන්නට විශාල තැනිතලාවකි. මුළු තැනිතලාවම නටබුන් සහිතය. එහි පසින් ගොඩ වූ දිය දෝතක් පමණ රැඳි මධ්‍යම ප්‍රමාණයේ පොකුණකි. මේ තැනිතලා භූමිය පසුකරමින් කඳු මුදුන නගින විට විශාල ගල් කුළු හමුවෙයි. විශාල ගල් කුලකට හේත්තු වූ තවත් එවැනි ගලකින් සුවිශාල ගල් ගුහාවක් නිර්මාණය වී තිබේ. එවැනි ගල් ගුහා විශාල ප්‍රමාණයකි. ඇතැම් තැනක කටාරම් කෙටූ ගල් ගුහා ද හමු වෙයි. මේ ගල්ගුහා වෙත ළඟාවීමේ දී ගල් පර්වතවල කපන ලද පියගැටපෙළවල් දකින්නට ලැබීම විශේෂය. මේවා ඉතා පුරාණ යුගයේ නිර්මාණය වූ ඒවා බව පෙනේ. එලෙසම කන්දේ බොහෝ තැන්වල අබලන් වූ කුඩා පියගැටපෙළ රැසක් ම දක්නට ලැබේ. කෙසේ වුවත් පුළුකුණාවේ නටබුන් අතුරින් වැදගත් තැනක් ලෙන් සංකීර්ණයට හිමි වෙයි. කඳුවැටියේ හැම තැනකින්ම විවිධ ප්‍රමාණයේ ලෙන් පිහිටා ඇත. මේවායින් සමහරක කටාරම් කොටා ලිපි පිහිටුවා ඇත. සමහරක කටාරම් ඇතත් ලිපි නැත. තවත් සමහර ලෙන් ස්වාභාවික ලෙස පිහිටා ඇත. මේ දැනෙන වර්ගයේ ලෙනක වුව එක් අයෙකුට හෝ විසිය හැකි ය. ඒ අනුව මේ ලෙන් සංකීර්ණය ඉතා දිගු කලක් විශාල භාවනානුයෝගී භික්ෂු පරපුරකට නවාතැන් සපයන්නට ඇති බව නම් පැහැදිලිය.

'නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය' නමැයින් සුවිසල් ග්‍රන්ථයක් සම්පාදනය කළ ස්වාධීන පුරාවිද්‍යා ගවේෂකයෙකු හා කීර්තිමත් ලේඛකයෙකු වූ පූජ්‍ය එල්ලාවල මේධානන්ද නාහිමියන් සිය කෘතියේ දී මෙම කඳුගැටයේ ලෙන් 70 ක් පමණ ද, ලෙන්වල තිබී පිටපත් කළ ශිලා ලේඛන 14 ක් පසුකර ඇති බවත් තමන් වහන්සේ විසින් අලුතින් ලිපි 03 ක් සොයා ගත් බවත් සඳහන් කරයි. එලෙසම 'පුළුකුණාව' යන්න පසුකාලීනව මෙම ස්ථානයට පටබැඳි නමක් බවත් මෙහි සත්‍ය නාමය විය යුත්තේ 'විහාරකන්ද' යන නම බවත් සඳහන් කරයි.

කඳු පාමුල තැනිතලාවේ පිහිටා ඇති සුවිසල් ශෛලමය ආසනඝරය මේ පුරාවිද්‍යා භූමියට එක්කරනුයේ අමිල වටිනාකමකි. අඩි 4 ක් පමණ පළලින් ද අඩි 10 ක් පමණ දිගින් ද යුත් මේ ආසනඝරය විවිධ කැටයමින් යුක්තය.

පුරාවිද්‍යාත්මක සාධක ගොඩගැසී ඇති පුළුකුණාව පුරාවිද්‍යා බිම්කඩ පිළිබඳ නිශ්චිත කාලරාමුවක තොරතුරු නොමැති මුත් මෙය ලක් දෙරණේ ඓතිහාසික ගමන් මගට සුවිසල් අත්වැලක් සැපයූ ස්ථානයක් බව නම් නිසැකය. ශෛලමය ගොඩනැගිලි පාදම්, විනාශ වූ ස්තූප, ලෙන් සංකීර්ණය, සුවිසල් ආසනඝර, පියගැටපෙළ, පොකුණු ආදිය ඊට නිදසුන් සපයයි. වියළි කලාපීය දේශගුණික වටපිටාවක ගතිලක්ෂණ ප්‍රකට කරන මේ භූමිය රතු-දුඹුරු පසින් යුක්තය. ආසන්නතම ජල මූලාශ්‍රය ශාන්තිමලේ වැවය. මුහුදු මට්ටමින් මීටර් 74 ක උසකින් පිහිටා ඇති මේ භූමියේ දෘශ්‍යමානතාව (*visibility*) පැහැදිලිය. වාස්තුවිද්‍යාත්මක අගය අතින් අතිවිශිෂ්ට ස්ථානයක් ලෙස සැලකිය හැකි අතර කලාත්මක අගය ද ඉහළය. [illegible] මිනිසුන්ගේ පහසින් විනාශ වී නොමැති මේ



නිර්මල භූමිය සැබෑ ශාස්ත්‍රකාමියෙකුට සුවිසල් කෝෂ්ඨාගාරයකි. මෙය පර්යේෂණ අවකාශය අතින් ඉතාම ඉහළ අගයකින් යුත් බව ද අපගේ හැඟීමයි.

දමිළ වැසියන් බහුතරයක් වෙසෙන පුළුකුණාව ගම්මානයට යන ගුරු පාර වැටී ඇත්තේ මේ නටබුන් තලය මැදිනි. පාපැදියක්, යතුරු පැදියක් වැනි සැහැල්ලු වාහනයක් හිමින් නම් ප්‍රවාහන පහසුකම් සලසා ගන්න ද මේ පුරාවිද්‍යා භූමියට (නටබුන් තලයට) හානියක් නොවේනැයි සිතිය හැකිය. එහෙත් ඉතා බරවාහන මේ නටබුන් තලය හරහා ධාවනය කිරීම ඛේදයකි. මේ බරවාහන ගමනා ගමනය වළක්වීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිහිප විටක් ම උත්සාහ ගෙන තිබුණද එය ව්‍යර්ථ වී ඇත. දෙපාර්තමේන්තුව විසින් මේ ස්ථානය පිළිබඳව සවිස්තර තිබූ විශාල නාමපුවරුව ද කිසිවෙකු විසින් කඩා බිඳ දමා ඇති අයුරු ද දක්නට ලැබුණි. වන ලැහැබින් ගැවසී ගත් මේ උත්සාහයේ පුරාවිද්‍යා භූමියේ වනසතුන් ගහනය. අලි ඇතුන් නිතර සැරිසරන මේ පුරාවිද්‍යා රක්ෂිතයේ කඳු මුදුන මත ඇති ලෙන් සංකීර්ණය ආශ්‍රිතව වන වළසුන් සහ තවත් වනසතුන් සැරිසරති. පර්යේෂකයින්, ගවේෂකයින්, විනෝදකාමීන් මේ ස්ථානය ප්‍රයෝජනයට ගත යුත්තේ බොහෝ ප්‍රවේශමෙන් හා කල්පනාකාරීවය.





සටහන
✍ සුනිල් බණ්ඩාර කෝරළගේ
ඡායාරූ : ලාල් බණ්ඩාර, අනිල් සමරවීර
විශේෂ සහය : අම්පාර පු. පු. කාර්යාලයේ [illegible]
[illegible]

# 17 වන සියවසේ දී මළවුන්ගේ නගරයක් වූ
# ගාලු පුරවරය



දකුණු ලකට සුවිශේෂීත්වයක් එක් කළ ගාලු කොටුවේ චමත්කාරජනක බව විඳගැනීමට දෙස් විදෙස් සංචාරකයින් එහි නිරන්තරයෙන් සැරිසරති. තුන් පැත්තකින් සමුද්‍රයෙන් වටවී අර්ධද්වීපයක් ලෙසින් පවතින ගාල්ල කොටුව එහි ස්වභාවික පරිසරය හා භූමි සැකසුම් මනාව උපයෝගී කර ගනිමින් කරන ලද නිමැයුමකි. ලන්දේසි ජාතිකයන් විසින් ක්‍රි. ව. 1640 දී පෘතුගීසින් හා සටන් වැද ගාල්ල බලකොටුව අත්පත් කර ගනු ලැබූ අතර පසුව විදේශීය වෙළඳ කටයුතු පහසුවෙන් සහ වඩාත් ලාභදායි ලෙසින් ඉටු කර ගැනීමට හැකි මධ්‍යස්ථානයක් වශයෙන් වැඩි දියුණු කරන ලදී. මෙහිදී බලකොටුව සීලන්ද ජනාවාසයක් සහ පරිපාලන මධ්‍යස්ථානයක් ලෙසින් පැවති අතර එහි ආරක්ෂාව සඳහා යුධමය ඉදිකිරීම් ද ස්ථාපිත කර වඩාත් සංවිධානාත්මක ස්වරූපයෙන් පවත්වාගෙන යනු ලැබීය.

මෙසේ සීලන්දයන් විසින් ගොඩනංවන ලද ප්‍රෞඪ නගරය මළවුන්ගේ නගරයක් බවට 17 වන සියවසේ දී පත්වූයේ ඔවුන්ගේ සිත් සතන් මරණයේ බිහිසෙන් අසරණ කරවමිනි. මෙලොව ජනිත වන සෑම ප්‍රාණියකු වුවද කෙදිනක හෝ මරණය නැමැති සුදනලාවේ සැතපීමට නියමිතය. එහෙත් අනපේක්ෂිත ලෙසින් දිගින් දිගටම සිය පවුලේ ඥාතීන් සහ හිතවතුන් අහිමි වීම මෙම ලන්දේසි ජාතිකයන්හට බලවත් ගැටළු නිර්මාණය කරන්නක් විය. මෙලෙස ගාල්ල මරණය රජ කරන නගරයක් ලෙසින් විශාල ප්‍රචලිත වීමට කරුණු කිහිපයක් බලපානු ලැබිණ. එනම්, පෘතුගීසීන් සමඟ නිරන්තර ගැටුම් ඇති වීම, දීර්ඝ මුහුදු ගමන් හේතුවෙන් ඇතිවන රෝගාබාධයන් නිසා මරණයට පත් වීම, වරායේ ඇති භයංකරත්වය මත වරාය දෙසින් නගරයට සේන්දු වන සංචාරකයන් හදිසි අනතුරු හේතුවෙන් මරණයට පත්වීම, අතිසාරය, කොළරාව, සහ කැළෑ උණ මෙන්ම වෙනත් රෝගාබාධ සීඝ්‍රයෙන් පැතිර යාම හේතුවෙන් විශාල ගාල්ල එකම මළගෙයක් බවට පත්ව ඇති ආකාරය හඳුනාගත හැකිය.

මෙම ප්‍රෞඪ නගරය මළවුන්ගේ නගරයක් බවට 17 වන සියවසේ දී පත්වීමට බලපානු ලැබූ අතීත සිදුවීම් රාශියක මූලාරම්භය ගාල්ල පෘතුගීසී ආගමනයත් එහි කළු කොටුව නොහොත් ෆෝර්ට්ලෙසා ගොඩනැංවීමෙන් පසු ජනිත වූ ආකාරය හඳුනාගත හැකිය. එහෙත් ගාල්ල නගරයට ආගන්තුක වූ කාලතුවක්කු හා වෙඩි හඬ හාත් පස අහස සිදුරු දෙමින් අඳුරු වලාපට මවමින් පරිසරය සකල කළ අවස්ථා අපමණ විය. ගාල්ල නගරයේ වාණිජ ප්‍රතිලාභ ලබමින් එහි කුරුඳු ඒකාධිකාරය අත්පත් කරගත් පෘතුගීසීන් එලවා හැර එහි පාලන බලය අල්ලා ගැනීමට සීලන්දයින් විටින් විට විවිධ අවස්ථාවල දී සටන් වැදීම මෙයට හේතු විය. මෙම සටන්වල උච්චතම අවස්ථාව ක්‍රි. ව. 1640 දී කමාන්ඩර් ජේකොබ් කෝස්ටර්ගේ මූලිකත්වයෙන් සිදු වූ අතර දින කිහිපයක ප්‍රයත්නයකින් පසු එම බලකොටුවේ පෘතුගීසීන් එලවා හැර එය සිය බලප්‍රදේශයක් බවට පත් කරගත් ආකාරය ඓතිහාසික මූලාශ්‍ර මගින් තහවුරු වේ. එතැන් සිට ක්‍රි. ව. 1656 දී කොළඹ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය බවට පත්වන තෙක්ම ගාල්ල සිය ප්‍රධාන පරිපාලන හා වෙළඳ මධ්‍යස්ථානය වශයෙන් සලකා සීලන්දයෝ කටයුතු කළහ.

මේ සඳහා බලපානු ලැබූ ප්‍රධානතම සාධකය කුරුඳු නම් සීලන්දයිනට මහත් වාසි අත් පත් කළ දේශීය ජනයා අතිශයින් පීඩාවට පත් කරනු ලැබූ වෙළඳ භෝගයයි. මෙම වාණිජ භෝගයෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ නිසා පෘතුගීසීහු ද විටින් විට ලන්දේසීන් සමඟ සටන් වැදුනහ. මෙම සියළු සටන්වල අවසන් ප්‍රතිඵලය නම් සිය දහස් ගණන් වැසියන් මරණයට පත්වී ගාල්ල මරණය රජ කරනු ලබන මධ්‍යස්ථානයක් බවට පත්වීමය. එසේම ග්‍රාමීය ආර්ථික රටාවකට සහ ස්වදේශීය චින්තන භූමියකට හුරුවී සිටි ගාල්ල හා ඒ අවට ජනයා මෙම පිට දේශක්කාරයින් හේතුවෙන් සියල්ල මුදල් මත තීරණය වන නිරන්තරයෙන් වෙනස් වන සහ වෙනස් කෙරෙමින් පවතින සමාජ, ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතිකමය වටා පිටාවකට හුරුවන අන්දම දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් ඇතැම් අවස්ථාවන්හි දී දේශීය සිංහල ජනයන් ද නොයෙකුත් ආර්ථික සහ සාමාජීය ඵල ප්‍රයෝජන අපේක්ෂාවෙන් මෙම විදෙස් ජාතීන් වෙත ගැතිකම් කළ අන්දම ඓතිහාසික මූලාශ්‍ර මගින් තහවුරු වේ. මෙම විදෙස් ජාතීන් දේශීය පිරිස් පාලනය සඳහා මුදලි මුහන්දිරම් සහ ආරච්චි වැනි දේශීය පාලකයන්ම යොදා ගත් අතර වරෙක මෙවැනි ගැහැට විඳ දරාගැනීමට අපොහොසත් පහත රට කුරුඳු පැළීමේ නිරත වූ සාමාන්‍ය අසරණ ජනයා කන්ද උඩරට රජු වෙත එලා ගොස් සිය දුක්ඛිත තත්ත්වයන් කියා පෑහ. මෙහිදී රජු විසින් ද පහත රට කුරුඳු පැළීමේ වැසියන්ගේ කැරලි සඳහා ඇතැම් අවස්ථාවන්හි දී අනුග්‍රාහකත්වය දක්වා ඇති ආකාරය පෙනීයයි. ක්‍රි. ව. 1761 දී වැන් එක් ආණ්ඩුකාරවරයාගේ කාලයේ දී ඇතිවූ මෙවන් කැරැල්ලක දී ගාල්ල සහ මාතර ප්‍රදේශයේ සීලන්ද ගොඩනැගිලි විශාල වශයෙන් විනාශ වූ අතර ජීවිත රාශියක් ද අහිමි විය.

17 වන සියවසෙහි ගාල්ල වරාය සහ නගරය





✍ එල්. එච්. තරංගා කුමාරි
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
කොටුව, ගාල්ල.

## ගිරි දිවයිනේ අතීත විත්ති සුරකින

# සංගප්පාලිය

ඉතිහාසයේ වංශ කථාවල සඳහන්වන ගිරි දිවයින, ගිරි නුවර, ගිරිබාරට්ඨ, ගිරිකඩරට යන නම්වලින් එය එම්. ඩබ්. කොඩ්රින්ටන් මහතාගේ 'දොළොස්වන ශතවර්ෂයේ ලංකාවේ දේශ විස්තරය' යන සටහනින්ද සී. ඩබ්. නිකලස් මහතාගේ 'පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන' යන්නෙන්ද, එල්ලාවල මේධානන්ද හිමිගේ 'වන්නි හත්පත්තුවේ සෙල් ලිපි හෙළි කරන තොරතුරු' නමැති සාහිත්‍ය කලාපයෙන් ද මනාව ඔප්පු කර ඇත. මී ඔය හා කලා ඔය අතර මිරියාවත් පාදක කරගනිමින් පිහිටි වූ ගිරිගාමිය ඇතුළු ජනාවාස සහිත භූමිය කාලයාගේ ඇවෑමෙන් නටබුන් ගොඩක් බවට පත් කරමින් ගොඩනැගුණු නව ජනාවාස මගින් හිස ඔසවන අතීත විත්ති ලෝකයාට ප්‍රකාශ කරන්නේ ගිරි දිවයිනේ අභිමානයයි. එවන් අභිමානයක් දැයේ දරුවන්ට හෙට උරුම කරන තවත් එක් සුවිශේෂී ස්ථානයක් ලෙස සංගප්පාලිය වේදස ගිරි වන අරණ හඳුන්වා දිය හැකිය.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 30 සංගප්පාලිය ගම් සෙවුවරේ පිහිටි ඉතා මනරම් කඳුගැටයක් මුදුනෙහි වූ සමතලා භූමියක මෙම පුරා සඩක බහුල වේදස ගිරි වනඅරණ පිහිටා ඇත.

2006 වර්ෂයේදී පුරාවිද්‍යාත්මක ගවේෂණ චාරිකාවේදී මෙහි ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු රාශියක් අනාවරණය කරගෙන ඇත. ප්‍රමාණයෙන් අක්කර 80 කට අධික වන රක්ෂිතයක් වන මෙහි ප්‍රදේශය වසා ගනිමින් අහසට පැන නැගුණ කඳු මුදුන මස්තකයෙහි නැගෙනහිර බෑවුමට වඩා බටහිර බෑවුම ප්‍රමාණයෙන් විශාල වේ. එහි උස් සමතලා භූමියක දැකගත හැකි විශේෂිත ගල් ලෙනකි. කටාරම් කෙටූ ගල් ලෙනෙහි ප්‍රතිමා 05 න් 03 ක් බුද්ධ ප්‍රතිමා වේ. ඉතිරි ප්‍රතිමා 02 බෝධිසත්ව පිළිම වේ. මීටර් 2.5 ක් පමණ උස වූ මෙම ලෙනෙහි දෙපස කොට බිත්ති 02 කි. එම බිත්ති සංරක්ෂිත ඒවා වේ. මෙහි දිග හා පළල මීටර් 4 හා 5 වශයෙනි. ලෙනෙහි විශාලතම බුද්ධ ප්‍රතිමාව මීටර් 1.6 ක් උස වේ. දෙවන හා තෙවන ප්‍රතිමා මීටර් 1.4 හා 1.2 වශයෙන් උස වේ. බෝධිසත්ව පිළිම දෙකින් එක් ප්‍රතිමාවක් ප්‍රමාණයෙන් කුඩා එකක් වේ. අනුරාධපුර යුගයේ අවසන් භාගයට පමණ අයත් මෙම ප්‍රතිමා සිරිගරුඬ වැනි විශේෂිත පාෂාණ වර්ගයකින් නිර්මිතව ඇත. ලෙනෙහි වූ ප්‍රතිමා සියල්ලම නිදන් හොරුන්ගේ ග්‍රහණයට ලක් ව ඇත. සියලුම ප්‍රතිමාවල හිස් හා අත් පා කඩා ඇත. හිස් කොටස් හා අත් කොටස් දක්නට නොලැබේ. බෝධිසත්ව හා බුද්ධ ප්‍රතිමාවල දකුණු අත්හි උරහිස ලඟින් හා වම් අතෙහි මැණික් කටුව ලඟින් කඩා දමා ඇත. එමෙන් ම මෙහි ඇති විශාල බුද්ධ ප්‍රතිමාවෙහි උදරය කොටස කුළුගෙඩිවලින් පහර දී සිදුරු කිරීමට උත්සහ කර ඇත. ප්‍රතිමාවන්හි අත් හා පා කොටස් පිළිබඳව කිසිදු තොරතුරක් අසන්නට නොලැබෙයි. සියලු ප්‍රතිමා කවන්දයකට පමණක් සීමා වී ඇත. සමහර ප්‍රතිමාවල පා කොටස් කීපයක් දක්නට ලැබෙයි. විකසිත පියුමක ආකාරයෙන් සියුම්ව නිර්මිත පිළිම පාදම් සිදුහත් බෝසතුන්ගේ උත්පත්තිය සිහිකරවයි. තවද එහි අඟල් 14 ප්‍රමාණයේ දිග හා පළල ඉතා කුඩා සිරිපතුල් ගලකි. ඊට ආසන්නව කුඩා පහන් ගලක් දක්නට ලැබේ.

මෙසේ කටාරම් කෙටූ විශේෂිත ගල් ලෙනට අමතරව තවත් කටාරම් කෙටූ ගල් ලෙන් 15 කට අධික සංඛ්‍යාවක් ඇත. කඳු මස්තකයට නැගීම සඳහා මෙගලමය පියගැට පෙළකි. පියගැට පෙළට දකුණින් ඉපැරණි ගොඩනැගිල්ලක් තිබූ බවට සාක්ෂි සපයන කණු පාදම් වලවල් 04 කි. ඉපැරණි චෛත්‍යය ගොඩැල්ල මේ වන විට සමතලා වී ඇත. පිහිටි ගල්තලාව මත පොකුණු 03 ක් වේ. එක් ලෙනක ලෙන් ලිපියකි. පුරාවිද්‍යාඥයින් විසින් එය පිටපත් කරගෙන ඇත. පියගැටපෙළ ආසන්නයෙහි වූ ගලෙහි සෙල් ලිපියකි. 'හරිතාමිත වැවේ බදු



ගර්මිලක විහාරයට පිදූ බව' සඳහන්ව ඇති බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. ඒ අනුව බදු මගින් යැපුණු විහාරයක් තිබූ බව ප්‍රකාශිත වේ. එම සෙල්ලිපිය ක්‍රි.ව. 02 වන සියවසට අයත් බවත් කියැවේ. එහි ඇති ලෙන් ලිපියෙහි අක්ෂර අනුව එය ක්‍රි.පූ. 1 වන සියවසට අයත් බවත් පුරාවිද්‍යාඥයෝ පවසති.

ප්‍රදේශයේ පවතින ජනප්‍රවාද අනුව මෙම භූමියේ ඓතිහාසික පසුබිම ක්‍රි.පූ. යුගය දක්වා දිවයයි. ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියන මෙහි අතීත තොරතුරු මෙසේය. විජය කුමරු ලංකාවට පැමිණ රාජාභිෂේක ලැබූ පසු යක්ෂ ගෝත්‍රිකයන් ගිරිදිවයිනට පලවා හැරි බවත් ඉන් පසු ඔවුන් එහි ඇති මහ වනාන්තරවල සැඟව ජීවත් වූ බවත් එම කණ්ඩායමේ කිරි කුවේණියගේ මව වන කවිසාලු පාලි සංගප්පාලිය ගල් ලෙනෙහි රැකවරණය පිණිස සැඟව ජීවත් වූ බවත් ප්‍රකටව පවතියි.

තවද අනුරාධපුර රාජධානියේ මුල් ම රජ වූ පණ්ඩුකාභය කුමරුට නම මාමණ්ඩිය වූ (ගිව) අභය රජුගේ දියණිය වූ ස්වර්ණපාලිය හමුව ඇත්තේ ද මෙම සංගප්පාලියේ ආශ්‍රිත කුඹුරු යායකදී බව තවත් ජනප්‍රවාද පවතති. ඒ අනුව මෙම ප්‍රදේශය 'වන පාලිය' ලෙස හැඳින්වූ බව ප්‍රදේශවාසීහු පවසති. වට්ටගාමිණී අභය (වලගම්බා රජු) රජු සොළී ආක්‍රමණ සමයේ පලාවිත් මේ ස්ථානයේ සැඟවගත් බවත් සොළී බලවේග පරදවා යළි රජවීමත් සමගම ගිරිදිවයිනේ සියලු ලෙන් ආශ්‍රිත ප්‍රදේශ භික්ෂූන්වහන්සේලා අරභයා පූජා කළ බවත් වංශකථාවල සඳහන් වේ. සංගප්පාලිය ලෙන් සංකීර්ණයද මෙසේ සඟසතුකොට පූජා කළ බව එහි ඇති ලෙන් ලිපියෙන් පැහැදිලි වේ. කාලයත් සමග මෙම ආරාමයේ තොරතුරු සොයාබලා සංඝයාවහන්සේලාට අවශ්‍ය පහසුකම් කරගැනීම සඳහා ගිරිබාර නමැති සෙන්පතියෙකු පත් කළ බව ප්‍රකට ජනප්‍රවාද කතා පවතති.

මීට දශක ගණනාවකට පෙර නිදන් හොරු විසින් විනාශ කර ඇති ප්‍රතිමා සහිත ලෙන තුළ වූ ප්‍රතිමා පිළිවෙළකට තැන්පත්කර එම ලෙන සුවිශේෂී ලෙනක් බවට පත් කරමින් මාර්තු මස ඇරඹි සංරක්ෂණ කටයුතු මැයි මාසයේ දී අවසන් කරන ලදී. මෙසේ මනාව සැකසූ සංරක්ෂිත ලෙන නැරඹීමට පිවිසෙන්නෙකුට එය දිස්වන්නේ ඓතිහාසික අනුරාධපුර රාජධානියේ දක්නට ඇති පුරාවිද්‍යා කෞතුකාගාරයේ සිරි ඉසිලූ ඉතා කුඩා කෞතුකාගාරයක් විලසිනි.

✍ ඒ. එම්. ආර්. සමන් කුමාර
වැඩබිම් කලමනාකාරී/ස්ථානභාර නිලධාරී
රාජාංගන පුරාවිද්‍යා ස්ථානය
පඬුවස්නුවර ප්‍රා. පු. කාර්යාලය.



# පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාවට නැගේ..

පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳව මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය අරමුණු අතර එකකි. ඒ වෙනුවෙන් ප්‍රකාශන එළිදැක්වීම, සම්මන්ත්‍රණ, ජංගම ප්‍රදර්ශණ, වැඩමුළු පැවැත්වීම ද අත් පත්‍රිකා බෙදාහැරීම වැනි වැඩසටහන් ද ක්‍රියාවට නැගේ. 2013 වසරේ ජූලි මස සිට 2014 වසරේ ජූලි මාසය දක්වා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් අප දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ අතර ඒ අතුරින් 2014 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව පුරාවිද්‍යා දෙපාර්තමේන්තු මැදිරිය මෙන් ම තවත් පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශන විශාල ප්‍රමාණයක් ද ලංකාව පුරාම සංවිධානය කරන ලදී. එමෙන්ම මහජනතාව, පාසල් ප්‍රජාව, පූජ්‍ය පක්ෂය, රාජ්‍ය නිලධාරීන් විශේෂයෙන් ග්‍රාම නිලධාරීන්, පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ලංකාව පුරාම ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන්ම පුරාවස්තු ආරක්ෂණ කොට්ඨාශය හරහා ලංකාව පුරා පිහිටි පොලිස් ස්ථාන හා සිවිල් ආරක්ෂක කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන් කැපී පෙනේ.





# ජාතික උරුමයන් සුරැකීම වෙනුවෙන් වෙනත් වෘත්තිකයින්ගේ දායකත්වය ඉහළට

ශ්‍රී ලාංකීය ජෛව උරුමය සුරැකීමට ස්වදේශික මෙන්ම විදේශීය විද්වතුන්, පරිපාලකයින් සහ සාමාන්‍ය සිවිල් වැසියන් බොහෝ දෙනෙක් පෙළ ගැසී සිදු කළ මහඟු කැපකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අද මෙරට ජාතික උරුමයන් විද්‍යාමානය. ඔවුන් එලෙස කරනුයේ ජාති මාමක හැඟීමකින් විනා කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් නොවේ. අතීතයේදී මෙන්ම වර්තමානයේත් අනාගතයේත් අඩු වැඩි ලෙස එය එලෙසම සිදුවනු ඇත.

වර්තමානයේ ජාතික උරුමයන් සුරැකීමට දේශපාලන අධිකාරියටද පරිපාලන ව්‍යුහයකට ද බලය පැවරී ඇත. ඒ වෙනුවෙන් නෛතික බලය පැවරූ ආයතන කිහිපයක්ද පිහිටුවා ඇත. ඒ ඒ ආයතන සිය ඉලක්ක සපුරා ගනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන සහ තම ආයතනය සතු මානව සම්පතේ ප්‍රමාණයටය. නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය ජාතික උරුමයන් සුරැකීමට බැඳී සිටී. එය ඔවුන් උර මත පැටවී ඇති වගකීමකි. එම සුවිසල් මෙහෙවරට නොදෙවෙනි කැපකිරීමක් කරමින් ලාංකීය ජෛව උරුමය අනාගතය වෙත ප්‍රදානය කිරීමට පෙළඹෙන වෙනත් වෘත්තිකයින්ගේ දායකත්වය ද කැපී පෙනෙන වර්ධනයක් ලබා ඇත.

ඒ අනුව පූජ්‍ය පක්ෂය, දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු, නීතිඥයින්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ආරක්ෂක අංශ නිළධාරීන්, ජනමාධ්‍යවේදීන්, ගුරුවරු, පුද්ගලික ආයතන, බැංකු සහ තවත් නොයෙක් ස්වෙච්ඡා සංවිධානවල ක්‍රියාකාරීන් සිවිල් වැසියන් අපේ උරුමය සුරැකීමට නෛතික බලය හිමි ආයතන හා අත්වැල් බැඳගනිමින් සිටිති. එලෙස අත්වැල් බැඳගන්නා සිය දහස් දෙනෙක් අතරේ මෙවර කලාපයෙන් කිහිපදෙනෙකු පිළිබඳව කෙටි සටහනක් තබමු.

වෛද්‍ය රවින් මාරසිංහ මහතා කළුබෝවිල මහ රෝහලේ වෛද්‍ය නිලධාරියෙකි. ඔහු සිය කාර්ය බහුල රාජකාරී ජීවිතය අතරතුරේ සංවිධානය කළ 'අපේ උරුමය - මගේ ඇසින්' පුරාවිද්‍යා ප්‍රදර්ශනය දෙවන වරටත් පසුගියදා කළුබෝවිල මහරෝහලේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. වසර ගණනාවක් බොහෝ වෙහෙස මහන්සි වී ප්‍රදර්ශනයට ගොනු කර තිබූ ඡායාරූප ඵලකවලින් සියයට අනූවක් පමණම පුරාවිද්‍යා ස්ථාන අළලා නිමැවුණු ඒවාය. සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද හාමිමියන් සහභාගි වූහ. මෙම අවස්ථාවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මැදගොඩ අභයතිස්ස හාමිමියන්, කළුබෝවිල ජාතික රෝහලේ බෞද්ධ සංගමයේ අනාගාරික ලංකානන්ද හිමියන් ද රෝහල් අධ්‍යක්ෂ අශේල ගුණවර්ධන මහතා ඇතුළු විශේෂඥ වෛද්‍යවරු ඇතුළු රෝහල් කාර්යමණ්ඩලයේ විශාල පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගි වූහ. පාසැල් ළමුන් විශාල පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වී සිටීම කැපී පෙනේ.

බණ්ඩාරගම රයිගම පිහිටි පුෂ්කරාරාමය හෙවත් පනාවිත්ත පැරණි පොකුණේ කැණීම් කටයුතු සඳහා මේ වනවිටත් දායක වන ගරුතර හාමිමියන් වගේම පානදුර මහරෝහලේ වෛද්‍ය හර්ෂ කුලුකගේ මහතා ප්‍රමුඛ සිංහ සමාජ සාමාජිකයින් ද මෙහිදී සිහිපත් යුතුව ඇත. එම වෛද්‍යවරයා ඇතුළු සිංහ සමාජ සාමාජිකයින් දැරූ දැඩි ප්‍රයත්නයක ප්‍රතිඵල ලෙස මේ වන විට පනාවිත්ත ඉපැරණි පොකුණේ සංරක්ෂණ කටයුතු අවසන් අදියරට පැමිණ තිබේ.






# මළවුනට ගරු කරමින් විල්පත්තුවේ තනිවුන සොහොන් බිම

# පොම්පරිප්පුව

අවුරුදු වසර බොහෝ අතකට පෙර මෙබිම ශිෂ්ටාචාරගත වූ මිනිසුන් පිරි ජන භූමියකි. අපේ මිනා ඉමෙන් කොමෙන් මැසී යන වික් සතයක් වෙයි. ඒ අප සිත් අම්හිර යුධ මිසසයන් තුල වෙඩි හඬට සිරවූ කාලයයි. ඒ යුගය නිමවීමත් සමඟ කුරුලු නදින් දොරටු විවරවන උතුරුකරයේ විල්පත්තුවේ උරුමය දකින්නට දැන් විසිතේ හැකිය. සංචාරණයට විවෘත වූ ඒ ඉඩ ලබාගැනීම ශ්‍රී ලාංකිකයෙක් ලෙසට ඔබ අනිවාර්යයෙන්ම කළ යුතුය. ඒ අනුව පුත්තලම හා මන්නාරම යන දිස්ත්‍රික් දෙකටම අයත්වූ විල්පත්තුව වනෝද්‍යානයේ දකුණු දෙසින් හමුවන මෙම සොහොන් බිම කලා ඔයට උතුරින් පිහිටා ඇත. උතුරු අක්ෂාංශ 08° 26' හා නැගෙනහිර දේශාංශ 080° 00' අතර ස්ථානගත වූ නමින් පොම්පරිප්පුව නම් සොහොන් බිම අපට කියාදෙන සංස්කෘතික පාඩම් බොහෝ වටිනාය. මුහුදු මට්ටමේ සිට අඩි 0 - 152 ත් අතර වෙනස්වන උසකින් යුතු මේ බිමකඩට වාර්ෂික උෂ්ණත්ව මධ්‍යනය සෙන්ටිග්‍රේඩ් අංශක 27.2 ක් ද වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1000 දක්වා ද ලැබේ.

පුරාවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ගත්කල පොම්පරිප්පුව යනු යකඩ සොයාගැනීමත් සමඟ බිහිවන පූර්ව ඓතිහාසික යුගයේ දී දියුණු මානව ජනාවාස කලාපයක් සහිත ජනාකීර්ණ පරිසර කලාපයකි. ඒ බැව් මේ භූමි පුරාවට විසිර පැතිර පවතින වළං කැබලිති සාක්ෂා දරයි. මෙම සොහොන් භූමිය පිළිබඳව පළමු ඉඟිය ලබාගන්නා ලද්දේ වර්සර් පුත්තලම් ප්‍රදේශයේ ඉඩම් මැනීම සඳහා ගිය විදෙස් ජාතික ඒ. වම්. හෝර්කාට් මහතා විසිනි. ඔහු විසින් මෙම ස්ථානයේ සොහොන් කීපයක් කැණීම් කළ බවට වාර්තා කර තිබේ. එහෙත් ඉන් හෙළිකරගත් දෑ පිළිබඳව තොරතුරු මෙතෙක් හෙළිව නැත. මීට අනතුරුව සිටින් කොරුනගේ ග්‍රහණයෙන් වසන්වන්නට නොහැකිව සොහොන් කීපයක් විනාශ වී ඇත. ඉන් අනතුරුව මෙම සොහොන් කලාපය පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කර ඇති පුරාවිද්‍යා කොමසාරිස් රාජා ද සිල්වා මහතා 1956 වර්ෂයේ දී කැණීමක් සිදුකරමින් පාදාගත් වළංකටු විශ්ලේෂණයෙන් දළ වශයෙන් ක්‍රිස්තු පූර්ව 02 - 01 කාලයට අයත් විය හැකිබව දක්වා ඇත. කෙසේ උවද විද්‍යාත්මක කාලනිර්ණයන්ට තවමත් හසුනොවුන මෙම



සොහොන් භූමියෙන් එකල විසුවන්ගේ සංස්කෘතික වපසරිය පිළිබඳව පැහැදිලි කරගැනීමට හැකිව තිබේ.

මෙම සොහොන් පිළිබඳව පුළුල් පරියේෂණයක් මුලපුරන්නේ වෙනිසියුලා විශ්ව විද්‍යාලය හා ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව 1970 දී විමලා බෙග්ලිගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසිනි. 1970 ජූලි හා අගෝස්තු යන මාස ද්වීත්වයෙහි කැණීම් කටයුතු සිදුකර ඇති අතර කැණීම් පරිලය මීටර් 100 × 100 ප්‍රමාණයෙන් දියත්කොට තිබිණ. බෙනට් බොන්සන් හා මොහොමඩ් මුවරප් යන දෙදෙනාගේ නාම ද සහාය ද විමලා බෙග්ලි මහත්මිය වෙත ලැබී ඇත. වර්තමාන වැව ආසන්නව, මාර්ගය දෙපස කොටස් මෙලෙස කැණීම් කර ඇත්තේ මීටර්



01 × 01 ට බෙදාගන්නා ලද අතුරු කොටු දැලට අනුවය. මතුකරගන්නා ලද වළවල් සංඛ්‍යාව 14 ක් වන අතර ඉන් ගොඩගෙන තිබූ වළං (Pot) ප්‍රමාණය 84 ක් ලෙසට දක්වා තිබේ. වළං ඇතුලත තැම්පත්කර තිබූ අස්ථි කොටස් මගින් අනාවරණය කරගෙන ඇත්තේ මිනිසුන් 23 දෙනෙකුගේ පමණ නියෝජනයක් පවතින බවත් වයස් බේදයකින් තොරව පිරිමි හා ගැහැණු යන දෙපාර්ශවයම සමාන වාර්තානුකූලව මිහිදන් කර තිබූ බවත්ය. විමලා බෙග්ලි මහත්මිය ඇයගේ පර්යේෂණයන්ට නතුකල සොහොන් ගර්භයන් දකුණු ඉන්දියාවේ ප්‍රාන්තයන්ගෙන් හමුවන සොහොන් සමඟ සංසන්දනය කර විග්‍රහයක් ද ලබාදී ඇත. ඒ අනුව මෙම සොහොන් දකුණු ඉන්දීය සම්ප්‍රදායන්ගේ සම්භවයක් ලෙසින් පැහැදිලි කරදීමට ඇය උත්සාහ කරන අතර එය හුදෙක් විකම්පිත උත්සාහයක් පමණි. කැණීම් මගින් මතුකරගන්නා ලද පුරාවස්තූන් දෙස විශ්ලේෂණාත්මකව බැලීමෙන් පැහැදිලි වන්නේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ දී මවුන් සතුව ඉතා තුම්වත් තාක්ෂණික මෙන්ම උසස් සංස්කෘතික වටපිටාවකට හුරුකමක් දැක්වූ බවයි.



පොම්පරිප්පුව සොහොන් ගර්භයන්ගේ ආකාරිකමය ලක්ෂණ වන්නේ බරණි සම්ප්‍රදායයි. එනම් විශාල ලෙස මැටියෙන් තනාගත ලද බරණි තුළට මළවුන්ගේ භස්මාවශේෂ හා වෙනත් දෑ (Grave Furniture) මැටි වළං හි යොමා අභිචාර ක්‍රම භාවිතයන් තුලින් තැම්පත් කිරීමයි. ඉන් අනතුරුව ගල් පියනක් මගින් ඉහළ ආවරණය කරනු ලබයි. මේ සඳහා වැඩිවශයෙන් ම භාවිතයට ගෙන ඇත්තේ හුණුගල් පතුරය.

කළුල ස්වරූපී අයුරින් මළසිරුරු මිහිදන් කළේ ප්‍රාග් මානවයාය. එය අභිචාරයකි. පූර්ව ඓතිහාසික මිනිසාට ද හුරුවන්නට ඇත්තේ එම අභිචාරයන්ගේම වර්ධනයක් විය හැකි වන්නේ ඔහු ජීවත් වූ කල භාවිත කළ බොහෝ දෑ අභිචාරයන් ලෙස මිහිදන් කිරීමට ලක්කිරීමය. 1971 කැණීමෙන් මතුවූ පබළු 136 *(Beads)* කියාපාන්නේ මියගිය ද ඔවුන් සතු දෑ ඔවුන් වෙතටම ලැබිය යුතු බවට වූ එකල විසුවන්ගේ විශ්වාසයම විය හැකිය. විමලා බෙග්ලි මහත්මියගේ කැණීමෙන් මතුවූ වළං අතර රතු කළු, *(Black & Red Were)* රතු, *(Red Were)* වෙරා කොටා නොහොත් පුළුටු භාණ්ඩ *(Tera Cotta)* හා අර්ධ වශයෙන් පිළිස්සූ මැටි බඳුන් ප්‍රධානය. එම වළං බොහෝමයක විවිධ සංකේත මෙන්ම *(Symbol)* අක්ෂර ද *(Graffiti)* සටහන්ව තිබූ බැව් හෙළිකරගෙන තිබේ. බොහෝ සෙයින් දියුණු සංනිවේදන ක්‍රමෝපායන් මෙන්ම භාෂා භාවිතයේ ප්‍රවණතා පිළිබඳව ඔවුන් විසින් ඉතිරිකර දමාගිය එම ශේෂය ඉතාම වැදගත්ය. එමගින් මතුවන ඉතිහාසය නිවැරදිය.

ඉහතින් දක්වන ලද මැද් භාජන කලාව *(Pottery)* පිළිබඳව අධ්‍යනය කරන ලද විමලා බෙග්ලි මහත්මිය මාදිලි 32 යටතේ *(Pottery Type)* වෙන්කරගෙන ඇති අතර එතුලින් එකල වළං භාවිතය පිළිබඳව වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් කරගෙන තිබේ. ඒ අනුව පූර්ව ඓතිහාසික යුගයේ විශාල බරණි පවා නිපදවා තිබීමෙන් ඔවුන්ගේ මැද් බඳුන් කලාවේ තාක්ෂණික වපසරිය ඉතාම මැනවින් පැහැදිලි වේ.

එච්.එම්.එස්.කේ. සමන්
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (කැණීම්)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
සීතාවක.

## සැඟවුණු උරුමයක අසිරිය

# කිරිමකුළුගොල්ල...



දෙපළව ඉතිහාසයක දෘශ්‍යමාන සාධකයන් අනාගතය වෙත දායාද කරන්නට ඉඩ හසර වෙන් වූ බිමක් ලෙස කිරිමකුළුගොල්ල හැඳින්විය හැකිය. සබරගමුව පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 260/B කළුපේවිගම ග්‍රාම නිලධාරී වසමේ කිරිමකුළුගොල්ල නටබුන් වූ ආරාම සංකීර්ණය පිහිටා ඇත.

කිරිමකුළුගොල්ල නටබුන් භූමිය අයත් වන දියවින්න ආශ්‍රිත කලාපයේ පුරාවිද්‍යාත්මක උරුමය ගවේෂණය කරන විට මෙම ලෙන් ආරාම පරිශ්‍රය හුදෙකලාව පිහිටි ස්ථානයක් නොවන බව පැහැදිලිව පෙනෙයි. බුදුගල, පම්බහ, හඳගිරිය, කූරගල, බඹරගල, පිළිම ඇද්ද ආර සහ අබේගොට (වර්තමානයේ දී උඩවලව ජාතික වනෝද්‍යානයට අයත්ය.) වශයෙන් කිරිමකුළුගොල්ල ආශ්‍රිත කලාපයෙන් හඳුනාගෙන ඇති පුරාවිද්‍යා පරිශ්‍රයන් හා ඒකාබද්ධව පැවති මධ්‍ය වලව නිම්නය කේන්ද්‍රගතව බිහි වූ බෞද්ධ ශිෂ්ටාචාරයේ සුවිශේෂී වූ බිම්කඩක් වශයෙන් කිරිමකුළුගොල්ල හඳුන්වා දීම නිවැරදි වෙයි. එපමණක් නොව මෙම ප්‍රදේශයේ ඓතිහාසිකත්වය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වාම අතට දිවෙන බවට පැහැදිලි සාධකයන් ද හමු වෙයි. බෙල්ලන්බැඳිපැලැස්ස, කූරගල, පියංගිරිය, බඹරගල ආදී ප්‍රාග් මානව වාසභූමි හමුවන්නේ ද කිරිමකුළුගොල්ලට ඉතා ආසන්නයෙනි.

වලවේ ගංගාව ආශ්‍රිත රට මැදට වන්නට බිහි වූ ජනපද රාශියක් මේ වන විට හඳුනාගත හැකි වී ඇත. කල්තොට, පොරුවන්නාන්සේගම, ගල්පාය, හඳගිරිය, රිදියගම ඒ අතරින් කිහිපයක් වන අතර කිරිමකුළුගොල්ල ද එසේ බිහි වූ ආර්ය ජනාවාසයක් බවට ඓතිහාසිකමය තොරතුරු අනුව සනාථ වේ. දිවයිනේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූ අනුරාධපුරයට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශ ආශ්‍රිතව තවත් කුඩා දේශපාලන ඒකක පැවති බවට සාධක හමු වන අතර වලවේ ගංගාවේ අතු ගංගාවක් වන කටුපත් ඔය නිම්නයේ බිහි ව පැවති 'හිරි නුවර' නමින් හඳුන්වනු ලැබූ පාලන ප්‍රදේශයට කිරිමකුළුගොල්ල ද අයත් ව පැවති ඇති බව පෙනෙයි.

දියවින්නේ පිහිටි වර්තමානයේ 'වඳ කුඹුර' වශයෙන් හඳුන්වනු ලබන පුරාණ වැව ආශ්‍රිත කලාපයට ඉතාම ආසන්නව ගනේලන්ද දේවගිරි ලෙන් විහාර භූමිය, මාලිගා ගොඩැල්ල, පියංගිරිය සහ කිරිමකුළුගොල්ල පුරාවිද්‍යා භූමි පිහිටා ඇත. අතීතයේ දී සුවිශාල වූ විහාර ආරාම සංකීර්ණයක් ලෙස ඒකාබද්ධව සහ සම්බන්ධතා පවත්වන්නට ඇති බව සිතිය හැක්කේ, මෙම භූමි සියල්ලම එකම යුගයකට අයත් බවට ලැබෙන පුරාවිද්‍යාත්මක සාධක අනුව සනාථ කොට ගත හැකි වීම නිසාය. වඳකුඹුර පුරාණ වැව පිහිටි භූමියේ සිට කිරිමකුළුගොල්ල දක්වා ඇත්තේ කි.මී. 2 ක පමණ සුළු දුර ප්‍රමාණයක් වන අතර වැව ආසන්නව පිහිටි දේවගිරි ලෙන් විහාර භූමියේ සිට පියංගිරිය ලෙන ඇතුළු කිරිමකුළුගොල්ල දක්වා ඇත්තේ කි.මී. 1 ක් පමණ කෙටි දුර ප්‍රමාණයක් වීම ඉහත සම්බන්ධතාවලට සෘජුව බලපාන්නට ඇත.

පියංගිරිය මෙන්ම උඩිපියං ගල්ලෙන කිරිමකුළුගොල්ලේදී අපට හමුවන අපගේ ප්‍රාග් ඓතිහාසික උරුමයේ සුවිශේෂී ස්ථානයකි. වන ගහණයට මැදිව පිහිටි මෙම ගල්ලෙන ප්‍රාග් මානව වාසභූමියක් ලෙස පැහැදිලිව හඳුනාගෙන ඇති අතර පසු කාලීනව සංඝයා වහන්සේලා උදෙසා පූජා කරන ලද ලෙන් ආරාමයක් බවට පත් වූ ස්ථානයකි. පේළි දෙකකින් යුක්තව සකස් කරන ලද කටාරම් සමග පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් යුත් සෙල්ලිපියක් ලෙනෙහි දක්නට ඇත. ලෙන් පරිශ්‍රය දිගින්, පළලින් සහ උසින් මීටර් 33 ං 11 ං 12 ප්‍රමාණයේ විශාලත්වයකින් යුක්තය. උත්තර ගුප්ත, චූල සහ සාගපෙ යන භික්ෂූන්ගේ නම් සෙල්ලිපියෙහි සඳහන් වන අතර මවුන් ප්‍රදේශයේ විසූ ප්‍රභූන් විය යුතුය. ලෙන් පියස්සෙහි බදාම ස්ථරයක් දක්නට ඇති අතර එහි සිතුවම් හෝ සටහන් තිබුණේ ද යන් පැහැදිලිව හඳුනාගත නොහැකිය.

කිරිමකුළුගොල්ල රක්ෂිතය තුළ දී කටාරම් සහ සෙල්ලිපි සහිත ලෙන් සමග ස්වාභාවික ලෙන් 10 කින් පමණ සමන්විත ලෙන් ආරාම සංකීර්ණයක් දක්නට ලැබෙන අතර, රක්ෂිතයට අයත් නොවන කඳු පාමුල තවත් ගොඩනැගිලි සංකීර්ණයක සාධක හඳුනාගත හැකිය. ලෙන් අනුරාධපුර යුගයේ මුල් කාලීන නිර්මාණයන් බව පෙනෙයි. මෙම ලෙන් ආරාම සංකීර්ණය ආශ්‍රිතව පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත සෙල්ලිපි 6 ක් දක්නට ලැබෙන අතර මේවායේ විශේෂත්වය වන්නේ, ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු මෙම ලෙන් ලිපි මගින් සනාථ වීම නිසා වෙයි.



එක් ලෙන් ලිපියක මෙසේ වෙයි

'උපසෝණ - අපි අය කොරන පුත

අය මහ සිවහා ලෙනෙ මහ පදසනෙ චතු දිශ.....

උපශෝන වැවෙහි අයිතිකරු වූ කිර කුමරුගේ පුත වූ මහා සිව කුමරුගේ මහාපදර්ශන ලෙන.....

මෙහි සඳහන් උපශෝන වැව, වර්තමාන වඳකුඹුර වැව විය හැකි බවට අනුමාන කළ හැකි අතර, කීර අයකොර, අය තිෂ හා අය මහ සිව යනු මෙම ප්‍රදේශයේ සිටි පාලකයන් හඳුන්වන නාමයන් විය යුතු ය.

කඳු මුදුනත ඉහත ලෙන් සංකීර්ණයට පහතින් කඳු පාමුල පැරණි ස්ථූපයක් සමග නටබුන් වූ ගොඩනැගිලි කිහිපයක ශේෂිත සාධකයන් ද දක්නට ලැබෙයි. ගල්කණු කොටස් බහුල වශයෙන් මෙම භූමිය තුළ විසිර පවතී. මේ අනුව කඳු මුදුනත ලෙන් ආරාම සංකීර්ණයක් හා සම්බන්ධව මෙම ගොඩනැගිලි පරිශ්‍රය ද පැවත ඇති බව පැහැදිලි වේ.



'කිරිමකුළුගොල්ල' අපගේ අතීත උරුමය මෙතෙක් පැවතියේ වනාන්තරය තුළ හුදෙකලාවය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම අපගේ මුතුන් මිත්තන්ගේ පිය සහර ගැටුනු බිමක් ලෙසට හඳුනාගත හැකි ශ්‍රේෂ්ඨ වූ පුරාවිද්‍යාත්මක උරුමයක් මෙම පරිශ්‍රයට ඇති බව මූලික පර්යේෂණයන් මගින් ම සනාථ වූ අතර අපගේ ඉදිරි පර්යේෂණයන් මෙම කලාපය තුළ තවදුරටත් පුළුල් පරාසයකට යොමු කිරීම පිළිබඳව මේ වන විටත් අපගේ අවධානය යොමු වී ඇත.


✍ **එස්. ඩී. පී. ඉශෝකා සන්දනායක**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
සීතාවක, අවිස්සාවේල්ල.

# ලංකාව පුරා පිහිටි ශිලා ලේඛන රැසක් පිටපත් කෙරේ

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක සහ අධ්‍යයනයේ දී ශිලාලේඛන, පුස්කොළ පොත්, සන්නස්, කාසි ආදී මූලාශ්‍ර ඉතා වැදගත් වේ. ඒ උක්ත මූලාශ්‍රවලින් නිවැරදි ම හා සත්‍ය සාක්ෂි අනාවරණය කර ගත හැකි බැවිනි. ප්‍රස්තුත අභිලේඛන හා කාසි ප්‍රධාන වශයෙන් ම ආරක්ෂා කිරීමේ, ඒවා ලේඛනගත කිරීම හා පවත්වාගෙන යෑමේ කටයුතු මෙන් ම ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ආදී කාර්යයන් ඉටු කෙරෙනුයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගිනි. ඒ යටතේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගින් වාර්ෂිකව ව්‍යාපෘති හයක් ක්‍රියාත්මක කරනු ලැබේ. ඊට අදාළ ව්‍යාපෘති 2014 වර්ෂයේ ද ක්‍රියාත්මක වෙමින් පවතී.

1. ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය.
2. ශිලාලේඛන සුවිගත කිරීමේ ව්‍යාපෘතිය.
3. පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය.
4. කාසි සුවිගත කිරීමේ ව්‍යාපෘතිය.
5. අභිලේඛන සුවිගත කිරීමේ ව්‍යාපෘතිය.
6. අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය.

ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2013 වසරේ ශිලාලේඛන 71 ක් පිටපත් කර ඇත. අනුරාධපුර, හම්බන්තොට, බදුල්ල, ත්‍රිකුණාමලය, කුරුණෑගල, කෑගල්ල, කොළඹ, අම්පාර, මාතලේ, මොණරාගල, පොළොන්නරුව, මඩකලපුව, මුලතිව්, මාතර, ගාල්ල, හා රත්නපුර යන දිස්ත්‍රික්කවලින් ප්‍රස්තුත ශිලාලේඛන පිටපත් කර ඇත.



ශිලාලේඛන සුවිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශිලාලේඛන සුවිගත කර ඇත. ඒ අනුව මිහින්තලේ ඇත් වෙහෙර, රාජගිරි ලෙන, කළුදිය පොකුණ, යන ස්ථානවලින් ශිලාලේඛන 80 ක් සුවිගත කරන ලදී.

2013 වසරේ ශිලාලේඛන පරිවර්තන නාමපුවරු යෙදීමේ ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 37 ක් සඳහා නාමපුවරු යොදා ඇත. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ප්‍රස්තුත නාමපුවරු යෙදීම සිදු කෙරිණි. එහි දී ශිලාලේඛනයේ ඓතිහාසික, ජාතික හා ආගමික මෙන් ම ස්ථානයේ වැදගත්කම ආදී කරුණු සැලකිල්ලට ගෙන එකී ශිලාලේඛන සඳහා ප්‍රමුඛතාවය දෙනු ලබයි.


පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කාසි සුවිගත කිරීම ද 2013 වසරේ සිදු කෙරිණි. එය කාසි සුවිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කළ අතර එහි දී කාසි 500ක් මේ සඳහා යොදා ගැනිණි.

අභිලේඛන සුවිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෑරගල පද්මාවතී පිරිවෙනේ පුස්කොළ පොත් සංචිතයේ තිබූ පුස්කොළ පොත් 36 ක් සුවිගත කරන ලදී. මේ සුවිගත කරන ලද පුස්කොළ පොත් අතර ධර්ම ග්‍රන්ථ, පිරිත් පොත්, ජාතක කථා පොත් ආදිය ද වේ.





අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම ද 2013 වසරේ මෙම අංශය මගින් සිදු කළ නවත් ව්‍යාපෘතියකි. එහි දී වාර්ෂිකව පිටපත් කරන ලද ශිලාලිපි 31 ක් අංශයේ නිලධාරීන් විසින් කියවා පර්යේෂණයට ලක්කර ශාස්ත්‍රීය ග්‍රන්ථයක් වශයෙන් එළිදක්වන ලදී.



✍ **කේ.ටී.එස්. තාමල් කොඩිතුවක්කු,**
අධ්‍යක්ෂ (වැ.බ),
අභිලේඛන හා නාණක විද්‍යා.
✍ **ධම්මිකා ප්‍රියදර්ශනී ගමගේ,**
අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරී.

1 පිටුවෙන්...

## මහාචාර්ය කහිංහැම්..

1988 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි ඔහු ශ්‍රී ලංකාවේ අනුරාධපුර ඇතුල් නගරයෙහි කැණීම් කටයුතු හා සම්බන්ධ වූහ. 2006 වසරේ අනුරාධපුර සිටත කොටසේ කැණීම් කටයුතු ඇරඹූහ. එය 2010 වසර දක්වා ක්‍රියාත්මක කෙරුණි. එම කැණීම් වාර්තාව නිකුත් කිරීම වෙනුවෙනුත්, ඔහු පිළිගැනීම වෙනුවෙනුත් පසුගියදා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී උත්සවයක් සංවිධානය කර තිබුණි. මහාචාර්ය කහිංහැම් මහතා සමග ශ්‍රී ලාංකික පුරාවිද්‍යාඥයෙකු වන මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධනයන් ලුම්බිණියේ පුරාවිද්‍යා කැණීම්වල නියුතුව සිටියි. ඔහුගේ ආරාධනයෙන් කහිංහැම් මහතා ශ්‍රී ලංකාවේ සංචාරයකට එක් වෙයි. එංගලන්තයේ ඩර්හැම් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයාද වන කහිංහැම් මහතා එම සරසවියේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයාද වෙයි. ක්ෂේත්‍ර පුරාවිද්‍යා කටයුතුවල විශිෂ්ටයෙකු වන එතුමා බංග්ලාදේශය, නේපාලය, පාකිස්ථානය, ශ්‍රී ලංකාව වැනි රටවල පුරාවිද්‍යා කටයුතුවල නියැලුණු විද්වතෙකි. යකඩ යුගය, නාගරීකකරණය, ඉන්දීය සාගර වෙළෙඳාම් කටයුතුම, බුද්ධාගම ඇරඹීමේ පුරාවිද්‍යාත්මක සාධක වැනි කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ ඔහු ශ්‍රී ලංකාවේ ඓතිහාසික ඇතුල් නුවර කැණීම් හා සම්බන්ධ වූ විද්වතෙකි. ලෝකයේ මෑතකාලයේ මහත් ආන්දෝලනයකට තුඩු දුන් නේපාලයේ පුරාවිද්‍යා කැණීම් විශේෂඥයා. ඉරානයේ සංස්කෘතික උරුමය සුරැකීමට ද තම දායකත්වය සපයමින් සිටින ඔහු විදේශ රටවල් ගණනාවක සංස්කෘතික උරුමය එක්සත් ජාතීන්ගේ ලෝක උරුම සංවිධානයේ ලේඛනගත කිරීමට ද උර දී කටයුතු කළ අයෙකි.

විශේෂ ස්තූතිය
**මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

1 පිටුවෙන්...

## සම්මාන ප්‍රදානය...

සම්මාන ප්‍රදානෝත්සවයේදී 2013 වසර වෙනුවෙන් පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ විශාල පිරිසක් ගෞරව සම්මාන ලැබූහ. සම්මාන ප්‍රදානය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආචාර්ය නන්දා විජෙසිංහ මහත්මියගේ මෙහෙයවීමෙන් සංවිධානය කෙරුණු මෙම සම්මාන ප්‍රදානෝත්සවය අදියර දෙකකින් යුක්ත විය. උරුම ප්‍රසාද ප්‍රණාම ස්වර්ණ සම්මානයෙන් පිදුම් ලැබුවේ මහාචාර්ය ටී. ජී. කුලතුංග, මහාචාර්ය නිමල් ද සිල්වා, ආචාර්ය සෙල්මා ගුණවර්ධන, විද්‍යාජ්‍යෝති ගැමුණු සිල්වා සහ ආචාර්ය ජේ. බී. ජී විමලරත්න යන විද්වතුන්ය.

උරුම ප්‍රසාද ප්‍රණාම රජත සම්මානයෙන් පිදුම් ලැබුවේ ශාස්ත්‍රවේදී පුජ්‍ය ගංගොඩ චන්ද්‍රානන්ද ස්ථවිර, සමන්ත ගුණසේකර ජයන්ත සමරසිංහ, එල්. වී. ඒ ච මැල්, තිස්ස නාගොඩ විතාන යන විද්වතුන්ය.

මෙරට ජාතික උරුමයන් සුරැකීම වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය හා ධනය පරිත්‍යාග කළ ඔවුහු අනාගත පරම්පරාව වෙත මෙරට ප්‍රෞඪ අනන්‍යතාව උරුම කරදීමට ප්‍රයත්න දැරූ සුවිශේෂිතයින්ය. දේශයක උරුමයන් සොයා යෑමටත් ඒවා සංරක්ෂණය කොට ආරක්ෂා කර ගැනීම වෙනුවෙනුත් මේ ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයන් ගෞරව බහුමානයෙන් පිදුම් ලැබීම රටක පුරවැසියන් සියලු දෙනාගේ භාග්‍යයකි.

### පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනය රට වටා...

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු අතර පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය පුළුල් කිරීම ප්‍රමුඛ අරමුණකි. එම අරමුණ පසක් කරගනු වස් දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නගයි. ශාස්ත්‍රීය පොත පත එළිදැක්වීම සහ පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනය, දේශන, සම්මන්ත්‍රණ වැඩමුළු, අත් පත්‍රිකා බෙදාහැරීම ඉන් කිහිපයක් පමණි.

මේ වසර මුල් කාර්තුව තුළ පමණක් රටපුරා පැවැත්වූ පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශන අතරින් කිහිපයක් මෙසේය. 'මිහාවිත අභිමන' - පාදුක්ක සිරි පියරතන විද්‍යාලය, වාද්දුව ශ්‍රී දේරු විද්‍යාලය, පන්නල ජාතික පාසල, කැටවල්ල ජාතික පාසල, මෙත්මිරිය මධ්‍ය මහා විද්‍යාලය, 2014 දුපත කිරුළ ප්‍රදර්ශනය, දංකොටුව ඇඩ්ඩ වූ බාලිකා විද්‍යාලය, මොරටුව වේල්ස් කුමරි විද්‍යාලය, පොළොන්නරුව රාජකීය විද්‍යාලය, මහනුවර දේවිකල්ල වෙසක් කලාපය, කුරුණෑගල මලියදේව විද්‍යාලය, මාරවිල ශාන්ත ස්ටෙෆීන්ස් විද්‍යාලය, ගම්පහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලය, කිරිඳිවැල පොසොන් කලාපය, 2014 වෙසක් කලාපය නිමිත්තෙන් පුරාවස්තු සහ ධාතූන්වහන්සේලා ප්‍රදර්ශනය, කෑගල්ල වෙසක් කලාපය, මහර-සවිවිත වෙසක් කලාපය, බෞද්ධාලෝක වෙසක් කලාපය සහ මහියංගන පූජ රජමහා විහාරයේ පුරාවස්තු ප්‍රදර්ශනය, ඓතිහාසික චිත්‍රකලාවේ ප්‍රදර්ශනය, ශ්‍රීලාංකික බිත්තු සංස්කෘතික මධ්‍යස්ථානයේ පුරාවිද්‍යා ප්‍රදර්ශනය, පොසොන් කලාපය - කැලණිය වේවැල්දූව, පුස්සෙල්ලාව ප්‍රාදේශීය ආදී ස්ථානයන්හි පැවති පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශන කිහිපයක් පමණි.

## ලාංකීය බුද්ධ ප්‍රතිමාව සහ එහි විචිත්‍රකරණය

21 පිටුවෙන්...

විචාත් සංකීර්ණ ස්වරූපයක් දක්නට ලැබෙන්නේ ගම්පොළ යුගයේ ප්‍රතිමාවල වූ දකුණු ඉන්දීය ලක්ෂණත් සමගිනි. ඒ අනුව මෙම ප්‍රතිමා පිහිටවූ ස්ථානයන් හි ඊට පිටුපසින් වූ බිත්තියෙහි මකර තොරණ සහ රශ්මි මාලාව දැක්වීම අනිවාර්ය අංගයක් වූ බව පෙනේ. මෙකල ජනප්‍රිය වූ ඉතා තද වර්ණ, බුදු පිළිමයට මෙන් ම අනෙකුත් විචිත්‍රකරණයන් සඳහා ද භාවිතා විය. ඒ අනුව මේවා සිත්තු ප්‍රතිමාවල දක්නට ලැබෙන ආකාරයේ දළු ස්වරූපයක් ගත්තේ ය. තද වර්ණ රශ්මිමාලාවට මල් වැල් එකතු කිරීම, මකර තොරණෙහි දේව රූප, සිංහ රූප, ද්වාරපාල රූප, ගණ රූප යෙදීම ද ඒවායේ සංකීර්ණ බව තවත් වැඩි කර තිබේ. ජනාමිශ්‍රිත රේඛා යොදමින් නිර්මාණය කළ චීවරය, ඉතා තද වර්ණ ගැන්වීම තුළින් තව තවත් ගෙළිගත බවක් පෙන්නුම් කර තිබේ.

බුද්ධ ප්‍රතිමාවේ මෙම විචිත්‍රකරණය බොහෝ කාලයක් යන තෙක් දක්නට ලැබිණි. විශේෂයෙන් ම මහනුවර යුගයේ අවසානය දක්වාම මෙකී ලක්ෂණ බුදු පිළිම නිර්මාණය සම්බන්ධ සිදු කෙරුණු අතර බුද්ධ ප්‍රතිමාවල අත්ලෙහි සහ යටිපතුල්වල මගුල් ලකුණු සටහන් කිරීම ද එහි විචිත්‍රත්වය සඳහා යොදා



ගනු ලැබිණ. අනුරාධපුර අවසාන භාගයේ සිට පැවති සිරස්පත යෙදීමේ සම්ප්‍රදාය මහනුවර යුගයෙන් මෙපිට දක්වාම පැවතෙන නමුත් පසු කාලවලදී එය සකස් කරනු ලැබුවේ ප්‍රතිමාවෙහි ශීර්ෂයට නොගැලපෙන තරම් විශාල ලෙසිනි.

මහනුවර යුගයෙන් පසු මෙහි ඇති විශේෂතාව වූයේ එතෙක් පැවති පැතලි සිරස්පත වෙනුවට හත් ගෙඩියක ස්වරූපය ගත් අඩිවර්ණ සිරස්පත බුද්ධ ප්‍රතිමාවට එක් කිරීම බව පෙනේ.

කෙසේ නමුත් පසුකාලීනව බුද්ධ ප්‍රතිමාවන්ගේ විචිත්‍රත්වය වැඩිකරනු පිණිස බොහෝ දුරට යොදා ගෙන ඇත්තේ ඉතා සිත් ගන්නා සුළු වර්ණ භාවිතා කිරීමය. ඒවා හුදෙක් බුදු පිළිමවලට නොගැලපෙන එහෙත් විචිත්‍රවත් වර්ණ වන අතර ප්‍රතිමාවල ශරීරාංග සඳහා තද කහ වර්ණ හෝ ඉඳ හිට රෝස පැහැයත්, චීවර සඳහා රතු, කහ සහ තැඹිලි වර්ණයත් භාවිතා කර තිබේ. මේ අනුව මුල් කාලීන බුදු පිළිමවල පැවැති ආධ්‍යාත්මික ස්වරූපය ඉක්මවා ගිය හුදු ගෙළිගත ස්වරූපයක් ඉස්මතු වීම පැහැදිලි වන අතර, මෙයින් පැහැදිලි කෙරෙන්නේ බුදු පිළිම නිර්මාණය කාලයාගේ ඇවෑමෙන් කිසියම් පරිහානියකට පත් වූ බවත් වඩා බුද්ධාලම්බන ප්‍රීතියෙන් සිද වැඩි ගිය කලා කරුවා තමන්ට හැකි උපරිම ශක්තියෙන් බුද්ධ රූපය නිර්මාණය කරන්නට වෑයම් කළ බවය.

# ලාංකීය බුද්ධ ප්‍ර

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බුදු පිළිම අතර සුන්දරතම නිර්මාණය ලෙස බොහෝ දෙනාගේ පිළිගැනීම වන්නේ අනුරාධපුර මහමෙව්නා උයනේ පිහිටි සමාධි බුද්ධ ප්‍රතිමාවයි. මෙරට බුදු පිළිම හෙළීමේ කලාව දෙස ආපසු හැරී බලන කල මේ ප්‍රතිමාව එහි පැරණිතම යුගයකට අයත් බව අවිවාදයෙන් පිළිගත හැකිය. එද සිට අද දක්වා වූ දිගු කාල වකවානුව තුළ දේශීය කලාකරුවා අතින් බිහි වූ නිර්මාණ තුළින් චලිතක්වෙලුයේ ඒවා කලාත්මක, නිර්මාණාත්මක මෙන් ම තාක්ෂණික යන කරුණු සියල්ල ඔස්සේ ම සිදු වී ඇති විකාශනයක් බවයි.



ශ්‍රී.පූ. සියවස්වලදී කලාකරුවන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ දී කරමින දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති ආකාරය ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අනාවරණය වේ. ඊට හේතු වී ඇත්තේ බුද්ධ රූපය නියමාකාරයෙන් ඉදිරිපත් කිරීමට නොහැකිවීම පිළිබඳ කලාකරුවන් තුළ තිබූ කිසියම් වූ පැකිලීමක් බව පැහැදිලි ය. මේ නිසාම ඉන්දියානු ශිල්පීන් බුදුරජාණන් වහන්සේ වෙනුවට උන්වහන්සේ නියෝජනය කරන්න වූ නොයෙක් සංකේත මාර්ගයෙන් බුද්ධ රූපය මවා පෙන්වීමට උත්සාහ ගෙන තිබේ. මේ සඳහා ධර්ම චක්‍රය, වජ්‍රාසනය, සිරිපතුල, බෝගස, ඡත්‍රය ආදී වූ නොයෙක් සංකේත භාවිතා කරනු ලැබීය. එහෙත් දේශීය කලාකරුවන් එවැනි සංකේත භාවිතයට වඩා බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කර වන්දනාමානයට ලක් කර තිබේ.

## ශ්‍රී ලංකාවේ බුදු පිළිම නිර්මාණයේ ඇරඹුම හා විකාශනය

ශ්‍රී ලංකාවේ මුල්ම බුදු පිළිම ගලින් තැනූ බවට බොහෝ ඓතිහාසික සාධක හමුවේ. දේවානම්පියතිස්ස රජුගේ කාලයේ දී කළ බුද්ධ ප්‍රතිමාවකට ඉන්පසුව වූ රජවරුද නොයෙක් පූජෝපහාර කළ බව වංශකතා කරුණු ගෙනහැර දක්වයි. එකල පාෂාණවලට අමතරව රනින් හෝ ලෝහයෙන් ද ප්‍රතිමා තනනු ලැබීය. දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑ ධාතු නිධානෝත්සවයේ දී රන් පිළිමයක් තැන්පත් කළ බව මහාවංශයෙහි සඳහන් වෙයි. ලක්දිව බුදු පිළිම හෙළීම පිළිබඳව විමර්ශනය කරන විට පැහැදිලිවන එක් කරුණක් නම් දේශීය බුද්ධ ප්‍රතිමාව තුළින් ඒවාටම අවේනික ලක්ෂණ බොහෝමයක් පිළිබිඹු වීමයි.

බුදුරජාණන් වහන්සේ පිළිබඳව මිනා අවබෝධයකින් හෙළන ලද ප්‍රතිමා පසලු ඉරියව්වකින් වැඩ හිඳිනා ආකාරයට සකස් කර තිබේ. එකම මුද්‍රාව, එකම ආසන විලාශය බොහෝ පැන්වල දක්නට ලැබුණ ද බුදුරජාණන් වහන්සේගෙන් පිළිබිඹුවන කරුණාවන්ත බවත්, ආධ්‍යාත්මික ලක්ෂණත් ඉදිරිපත් කරනු ලැබුවේ මදක් පහලට යොමා සිටින නෙත් යුවලත්, ඊට ම ගැළපෙන මඳ සිනහවත් ප්‍රතිමාවට ඇතුළු කරමිනි. ඉතා සරල මෙන් ම ආධ්‍යාත්මික ලක්ෂණ ද පෙන්නුම් කළ මුල් බුදු පිළිම අනුරාධපුර මධ්‍ය භාගයේ දී තරමක් වෙනස් ස්වරූපයකට ලක් වූ බව පෙනේ. සිවුරේ රැලි දැගර වීමත්, විශාල වශයෙන් රැලි සහිත සිවුරු දරා සිටින හිටි පිළිම නිර්මාණය බුදු පිළිමවල එතෙක් පැවැති ආධ්‍යාත්මික ස්වරූපයෙන් මදක් බැහැර කිරීමට හේතු වී ඇති බව පෙනේ. ක්‍රි.ව. 7 වන සියවසෙන් පසු මෙරට ප්‍රතිමා කලාවේ තවත් විශේෂ අවස්ථාවක් වන්නේ අති විශාල හිටි පිළිම නිර්මාණය කිරීමේ සම්ප්‍රදායයි. මේ කාලයේ දී ලක්දිව මහායාන බුදු දහම පැතිර ගිය බවත් දක්නට ලැබෙන අතර එම අදහස් අනුව බුදු පිළිමය තුළින් දීපංකර බුදුන් නිරූපණය කළ බවත් උන්වහන්සේ අසූ රියන් උස් වූ බවත් සිතමින් ප්‍රමාණයෙන් විශාල ප්‍රතිමා හෙළන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ දී රටේ ඇති වූ නොයෙක් යුධ කෝලාහල සහ අවුල් වියවුල් තත්ත්වයන් ද දේශපාලන වෙනස්වීම් ද ප්‍රතිමා කලාව කෙරෙහි තදින් බලපෑවේ ය. එකල නිර්මාණය දෙස බැලීමෙන් පැහැදිලි වනුයේ මුල් යුගයේ තිබූ ප්‍රතිමාවල විශිෂ්ටත්වය ක්‍රමයෙන් හීනි ගිය බවකි. අනුරාධපුර යුගයේ ප්‍රතිමාවල දක්නට ලැබුණු සරල සුන්දර බව වෙනුවට බරපතල ශරීරාංග සහිත තැඩි දැඩි ප්‍රතිමා මෙකල නිර්මාණය විය.



ගම්පල යුගය වනවිට ප්‍රතිමාකරණයේ තවත් විශාල වෙනසක් දක්නට ලැබේ. විශේෂයෙන් මෙකල හෙළු ප්‍රතිමා තුළින් බුදු පිළිමයක දක්විය යුතු ගුණාංග වෙනුවට නිරූපණය කෙරෙනුයේ ප්‍රතිමාව කෙරෙහි බැතිමතුන් තුළ නියමුසු හැඟීමක් දැනවීමට උත්සාහ කිරීමය. මේ කාලයේ බෙහෙවින් ජනප්‍රිය වූ දේව වන්දනාව නිසා බුදු පිළිමයට ද හින්දු දෙවිවරුන්ගේ ස්වරූපය ඇතුළු වූ බව පෙනේ. එම ප්‍රතිමා නිර්මාණය කළ ශිල්පීන් නියත වශයෙන් ම හින්දු භක්තිකයන් වූ ඉන්දියානු ශිල්පීන් වීම ඊට ප්‍රධාන හේතුව බව පැහැදිලි ය.

ගම්පොල අවධියෙන් පසු කාලයේ ප්‍රතිමාවල මුද්‍රාවේ හෝ ආසනයේ වෙනසක් දක්නට නොලැබුණ ද ඒවා බොහෝ විට දකුණු ඉන්දියානු ශෛලියට පමණක් නොව බුරුම, සියම් ආදී රටවලට ආවේණික ලක්ෂණ ද ඇතුළත් ව නිර්මාණය වූ බව පෙනේ. මේ කාලයේ කරන ලද ප්‍රතිමාවල විශේෂත්වය වන්නේ බුදු පිළිමයකින් ප්‍රදර්ශනය කෙරෙන ආධ්‍යාත්මික ස්වරූපයන් අභිබවා ගිය ශෛලිගත ස්වරූපයෙන් ඉස්මතු වී තිබේ.

ඉහත සඳහන් සියලු ලක්ෂණ පාදක කර ගනිමින් මහනුවර යුගයෙන් පසු එළඹෙන අවධියේ ප්‍රතිමා නිර්මාණය කරනු ලැබීය. ඒ අනුව ශිල්පීන් උත්සාහ ගෙන ඇත්තේ බුද්ධ රූපය සාත්වික අයුරින් නිරූපණය කිරීමට ය.



# මාව සහ ඒහි විචිත්‍රකරණය



## බුදුපිළිම නිර්මාණය සහ විචිත්‍රකරණය

මෙම සියලු කරුණු දෙස අවධානයෙන් බලන කල පැහැදිලි වනුයේ සියවස් ගණනාවක් පුරා නිර්මාණය කරන ලද බුද්ධ ප්‍රතිමා කාලය අනුව සහ ඒවායේ නිර්මාණ ක්‍රමවේදය අනුවත්, ඒ සඳහා මැදිහත් වූ ශිල්පීන්ගේ ගුරුකුල අනුවත් විවිධ ලක්ෂණවලින් යුතුව නිර්මාණය කරන ලද බවය. එහෙත් මේ සෑම අවධියකම කුමන හෝ ආකාරයකට නෙළන ලද ප්‍රතිමා විචිත්‍රවත් කිරීමේ ක්‍රමවේද ශිල්පීන් විසින් අනුගමනය කර ඇති බවට ද ඇතැම් සාධක මගින් අනාවරණය කර ගත හැකි ය.

බොහෝ විට මුල් අනුරාධපුර යුගයේ දී කරන ලදැයි සැලකෙන ශිලාමය ප්‍රතිමා මත සියුම් බදාමයෙන් ආලේප කර ඒ මත වර්ණ ගන්වා තිබූ බවට පැහැදිලි කරුණකි. වර්තමානයේ පවා මහමෙව්නාවේ සමාධි පිළිමයේ එවැනි වර්ණ ගැන්වූ තැන් ඉතිරි වී තිබීම වැදගත් සාධකයක් ලෙස පිළිගත හැකි ය. ජීවමාන ප්‍රමාණයට වඩා මඳක් විශාලව තනන ලද බුදු පිළිම හැරුණු කොට තරමක් කුඩා ප්‍රමාණයේ බුදු පිළිමවල රශ්මි මාලාවන් ද දක්වා තිබූ බව පෙනේ. විශේෂයෙන් ම හුණු ගලින් කරන ලද එවැනි පිළිම යාපනය ප්‍රදේශයෙන් සොයාගෙන ඇති අතර බුදු පිළිමයේ විචිත්‍රත්වය වැඩි කිරීම පිණිස රශ්මි මාලාව යෙදීම ඉන්දියානු සම්ප්‍රදායේ ජනප්‍රිය අංගයක් බව පෙනේ. ශෛලමය ප්‍රතිමා සඳහා ද රශ්මි මාලාව යෙදීම වෙනත් මාධ්‍යයන්ගෙන් කරන්නට ඇති බවට සාධක වංශකතාවලින් පැහැදිලි වේ. දේවානම්පියතිස්ස රජුගේ කාලයේ කළ පිළිමයට ධාතුසේන රජතුමා රැස්වලල්ලක් කළ බවත් දෙනෙත්වලට නිල් මැණික් එබ්බ වූ බවත් සඳහන් වේ. එම ප්‍රතිමාවටම සිලාමේඝවර්ණ රජතුමා හා හා මාණික්‍යයන්ගෙන් අලංකාර කර තිබේ. එම රජතුමාගේ අගමෙහෙසිය ට නිල් කිරුළක් පැළඳූ බව ද වංශකතාවේ සඳහන් වේ.





මේ අනුව මුල්කාලීන බුදු පිළිමවලට සිවුරු පෙරවූ අකාරයත් වෙනත් ද්‍රව්‍යවලින් ඒවා අලංකාර කළ බවත් බොහෝ සාධක හමුවේ. අනුරාධපුර අගභාගයේ දී බුද්ධ ප්‍රතිමාවේ විචිත්‍රත්වය සඳහා එහි පිටුපසින් විසිතුරු මකර තොරණක් යොදාගත් බව තන්තිරිමලේ හිඳි පිළිමය මගින් පැහැදිලි කෙරෙයි. ඇතැම්විට අතීතයේ දී මෙය වර්ණ ගන්වා තිබෙන්නට ඇත. මේ ක්‍රමයම අනුගමනය කරමින් ඊට පසු අවධියක දී පොළොන්නරුවේ ගල් විහාරයේ ලෙන තුළ පිහිටි බුද්ධ ප්‍රතිමාව පිටුපස දර්ශනීය මකර තොරණක් නිර්මාණය කර තිබේ. එම මකර තොරණ සමග ලෙන් බිත්තියේ ඉහළින් ඡත්‍ර සටහන් ද ඉතා විසිතුරු ආසනයක් ද සකස් කර ඇති අතර බුදු පිළිමය වඩා හිඳුවීම සඳහා ආසනය මත පද්මාසනය ද දක්වා තිබීම මෙකල නිර්මාණය කළ ප්‍රතිමාවල විචිත්‍රත්වය වැඩි කිරීමට හේතු වී තිබේ. ගල් විහාරයේ ම ඇති අනෙක් විශාල හිඳි පිළිමය පිටුපස ද, මකර තොරණක් දක්නට ඇති අතර එම පිළිමය ද පද්මයක් සහිත ආසනයක පිහිටුවා තිබේ.

අනුරාධපුර සහ පොළොන්නරු යුගවල ප්‍රතිමාගෘහ තුළ තැන්පත් කළ හෝ ඉදිකරන ලද ප්‍රතිමා වඩා විසිතුරු කරනු ලැබුවේ ප්‍රතිමාව පිහිටුවා තිබූ බිත්තියේ කළ සැරසිලි මගිනි. මේ සඳහා මකර තොරණ සහිත රශ්මි මාලා, බුදු සිරිත, හැටහොත් ජාතක කතා වැනි දෑ සිතුවම් කරනු ලැබීය. ප්‍රතිමා අලංකාර කරනු ලැබුවේ ඊට ගැළපෙන නොයෙක් වර්ණ භාවිතා කරමිනි. උදාහරණයක් ලෙස පොළොන්නරුවේ තිවංක පිළිමගෙය, ලංකාතිලකය වැනි තැන්හි ඇති ප්‍රතිමා සඳහා මෙම කරුණු අවධානයට ගෙන තිබේ.



ක්‍රි.ව. 7-8 සියවස්වලට අයත් ඇතැම් ප්‍රතිමා සඳහා සිරස්පත යෙදීම ද දක්නට ලැබේ. විශේෂයෙන් ම ලෝහ මාධ්‍යයෙන් කළ ප්‍රතිමාවන්හි මෙම ලක්ෂණ දක්නට පිළිවන. මේ අංගය එකතු කිරීම තුළින් බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් එකක් පෙන්නුම් කිරීමට උත්සාහ ගන්නා



ද ඉන් ප්‍රකට කෙරෙනුයේ ඒ වන තෙක් පැවත ආ සම්ප්‍රදායෙන් ඔබ්බට ගිය විසිතුරු කිරීමක් බව පැහැදිලිය. බුද්ධ ප්‍රතිමාවල විචිත්‍රකරණයේ

18 පිටුවට...

මහාචාර්ය මාලිංග අමරසිංහ,
අංශ ප්‍රධාන/පුරාවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයෙන් බිඳක්...

ප්‍රෞඪ දේශයක් සහ අභිමානවත් ජාතියක් බිහි කිරීමට පුරෝගාමී වූ අපගේ අතීත උරුමයන් අදටත් හෙටටත් මතුවටත් සුරක්ෂිත කර ඉදිරි අනාගත පරපුර වෙනුවෙන් දායාද කිරීමට පුරෝගාමී වූ ආයතනයක් වන හා මෙරට පුරාවිද්‍යාත්මක උරුමයන්හි ගෙනහික බලය හිමි පුරෝගාමී ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ජාතික උරුමයන් රැකගැනීමේ අදිටනින් 2013 වර්ෂයේ දී ද සුවිශේෂී ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවන ලදී. වෙනත් වර්ෂවලදී මෙන්ම 2013 වර්ෂයේ ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මහා පරිමාණ/මධ්‍ය පරිමාණ සහ සුළු පරිමාණ ව්‍යාපෘති 600 කට අධික ප්‍රමාණයක් ක්‍රියාවට නංවන ලදී.

2012 වර්ෂයේ ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක පහත සඳහන් විශේෂ ව්‍යාපෘති මේ අතර ප්‍රධාන තැනක් ගන්නා අතර, එම ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය පහත පරිදි වේ. මෙම විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට 2014 වර්ෂය සඳහා රු.මි. 61 ක් වෙන් කර ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේ ආරම්භ කර මේ දක්වාම ක්‍රියාත්මක වෙමින් පවත්නා සහ 2014 වසරේ ආරම්භ කරන ලද දැවැන්ත ව්‍යාපෘතිවලින් කිහිපයක් පහත දැක්වේ.

01. ගිලගිරි සෑය සංරක්ෂණ ව්‍යාපෘතිය
02. යුධගනාව දාගැබ සංරක්ෂණ ව්‍යාපෘතිය
03. තිවංක පිළිමගෙය සංරක්ෂණ ව්‍යාපෘතිය
04. මඩුවන්වෙල වලව්ව සංරක්ෂණ ව්‍යාපෘතිය.
05. රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතිය.

මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන මත සිදුකරනු ලබන සංරක්ෂණ ව්‍යාපෘති රැසකි. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- දීඝවාපිය දාගැබ කැණීමේ හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය.
- මිහින්තලය සංවර්ධන ව්‍යාපෘතිය.
- හම්බන්තොට මාටෙලෝ කුළුණ.
- මාතර සරම්මුදලි වලව්ව.
- පෝලංගමුව රජමහා විහාරයේ ධර්ම ශාලාව.
- බෙලිගම්මන ධර්ම ශාලාව.
- වට්ටාරම රජමහා විහාරය.
- දොඩම්ගොඩ විහාර ගෙය.
- උදුන්විට විහාරය.
- මුල්කිරිගල ලෙන් විහාරය.
- මාතර අපරැක්ක සිරි මහිරතනාරාමය.
- දොඩන්දූව සිරි පියරතන විහාරය.
- තෙල්වත්ත රන්පත් විහාරය.
- බූස්ස සිරි සුදර්ශනාරාමය.
- කොග්ගල ශ්‍රී දළින්දාරාමය.

## ගිලගිරි සෑය සංරක්ෂණ ව්‍යාපෘතිය



දාගැබ සංරක්ෂණයට පෙර






දාගැබ සංරක්ෂණය අනතුරුව

කැණීම් කටයුතු මේ වසරේ අවසන් කරන අතර, සංරක්ෂණ කටයුතු දැනට ආරම්භ කර ඇත. චෛත්‍යයේ මුල් පේසාවේ 1/4 ක් ද දෙවැනි පේසාවේ 1/4 ක් ද තුන්වැනි පේසාවේ 1/8 ක් ද සංරක්ෂණ කටයුතු සිදුකර ඇත. පේසා වළලුවල සංරක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමෙන් පසු ගර්භයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

## යුධගනාව සංරක්ෂණ ව්‍යාපෘතිය



දාගැබ සංරක්ෂණයට පෙර





දාගැබ සංරක්ෂණය අනතුරුව

## තිවංක පිළිමගෙය සංරක්ෂණ ව්‍යාපෘතිය





01 අදියර - පිළිම ගෙය සඳහා ආවරණ වහළ සකස් කිරීම.

ආවරණ වහළ සකස් කිරීමේ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් මේ වනවිට ආරම්භ කර ඇත. වහළ නිෂ්පාදන කටයුතු කර්මාන්ත ශාලාව තුළ මෙවනවිට සිදුකර ගෙන යන අතර, අවශ්‍ය අමුද්‍රව්‍ය විදෙස් රටවලින් ආනයනය කිරීමට සිදුව ඇත. භූමියේ සිදුකල යුතු පාදම් සකස් කිරීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇත.

## මඩුවන්වෙල වලව්ව සංරක්ෂණ ව්‍යාපෘතිය



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

## රජගලතැන්න සංරක්ෂණ ව්‍යාපෘතිය

විශේෂ ව්‍යාපෘතියක් ලෙස 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් විනාශයට ලක්වෙමින් පවතින ස්මාරක පාදාගෙන පුරාවිද්‍යා ක්‍රමවේදය අනුව සංරක්ෂණය කර, වර්තමාන හා අනාගත පරපුරට දායාද කිරීමට කටයුතු කෙරේ. දැනට සිදුකර ඇති පුරාවිද්‍යා ගවේෂණ මගින් රජගලතැන්න පුරාවිද්‍යා භූමියේ ස්මාරක 600 ක් පමණ සොයාගෙන ඇත. මෙම සංරක්ෂණ කටයුතු සඳහා මහා භාණ්ඩාගාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල හා ඇමරිකානු තානාපති කාර්යාලය මගින්ද ප්‍රතිපාදන ලබාදේ. මෙම ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් මෙහෙයවයි.



# මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන මත සිදුකරනු ලබන සංරක්ෂණ ව්‍යාපෘති කිහිපයක්..

## දීඝවාපිය දාගැබේ කැණීම් සහ සංරක්ෂණ කටයුතු



## මිහින්තලය පුරාවිද්‍යා ස්ථානය සංවර්ධන ව්‍යාපෘතිය



මිහින්තලය කළුගල් පොකුණ සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

## මුල්කිරිගල ලෙන්විහාර සංරක්ෂණ ව්‍යාපෘතිය



මුල්කිරිගල ලෙන් විහාරය සංරක්ෂණය අතරතුර

සංරක්ෂණයට පසු

## 2014 වර්ෂයට මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක වන සංරක්ෂණ ව්‍යාපෘති කිහිපයක්

- මහනුවර කතරගම දේවාල සංකීර්ණය සංරක්ෂණය
- මහනුවර උල්පැන්ගේ සංරක්ෂණය
- කුඹුරුපිටිය සපුගොඩ විද්‍යාතිලකාරාම විහාරයේ විහාරගෙය සංරක්ෂණය
- සෝමාවතී පුදබිමේ හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන කැණීම් හා සංරක්ෂණය
- රුවන්වැල්ල කොටුව (ප්‍රාකාරබැම්ම) සංරක්ෂණය
- බෙලිගම්මන ධර්මශාලාව සංරක්ෂණය

## 2014 වර්ෂයේ දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වයඹ සහ සබරගමුව පළාත්වල ක්‍රියාත්මක වූ වාස්තු විද්‍යා හා රසායන සංරක්ෂණ ව්‍යාපෘති

වයඹ පළාත

1. වේරගොඩ ස්තූප ගොඩැල්ල පාදා සංරක්ෂණය
2. සිස්සව ලෙන් විහාරය - සිතුවම් හා මූර්ති සංරක්ෂණය
3. අඹන්පොල සිරිමැවියාව ටැම්පිට විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය
4. කරුවලගස්වැව විලඳගොඩ විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය
5. මැද්දෙගොඩ විජයවර්ධන ටැම්පිට විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය

සබරගමුව පළාත

1. වැවල්දෙණිය විහාරයේ විහාරගෙය සංරක්ෂණය
2. අරබේගම ටැම්පිට විහාරයේ විහාරගෙය සංරක්ෂණය
4. මැදිල්ලිය ටැම්පිට විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය
5. බුරුන්නෑව විහාරයේ බිතුසිතුවම් හා මූර්ති සංරක්ෂණය
6. උදන්විට විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය
7. කන්දේගෙදර ටැම්පිට විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය
8. මෝරගම්මන ටැම්පිට විහාරය - බිතු සිතුවම් හා මූර්ති සංරක්ෂණය

## අරබේගම ටැම්පිට විහාරය සංරක්ෂණය



සංරක්ෂණයට පෙර

සංරක්ෂණයට පසු

## 2013 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංරක්ෂණ ව්‍යාපෘති කිහිපයක්

තොළුවිල චෛත්‍ය තහවුරු කිරීමේ සංරක්ෂණ ව්‍යාපෘතිය

සංරක්ෂණ කටයුතු සඳහා කැණීම් කර පාදාගන්නා ලද ගම්බේගමුව දාගැබ

සංරක්ෂණය කරන ලද කතාගල විහාරයේ ආවාසගෙය හා මහනුවර සියම්ගම්පාය පිළිමගෙය

කැලණිය රජමහා විහාරයේ බිතු සිතුවම් ඡායාරූප මාධ්‍යයෙන් වාර්තාගත කිරීමේ ව්‍යාපෘතිය



තොළුවිල චෛත්‍ය තහවුරු කිරීමෙන් පසු



කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය

✍ **පී. කේ. සුජීවා ප්‍රියංගනී,**
සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී
ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය
(සැලසුම් අංශය)

# 2013 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද සේවාව

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අතුරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. ඒ මේ රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සුවිශේෂී මෙහෙවර නිසාමය. භූමි ප්‍රමාණයෙන් කුඩා වූ දිවයිනක පිහිටා ඇති ලක්ෂ සංඛ්‍යාත පුරාවස්තු අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කරදීම එම මෙහෙවරේ එක් පැතිකඩකි. ප්‍රෞඪ ඉතිහාසයක සාඩම්බර හිමිකරුවන් බවට පත් වන්නට ශ්‍රී ලංකාවාසීන්ට නිරායාසයෙන් අත්වැල් සපයන, පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කරමින් එය සුරක්ෂිත කිරීමේ අධිකාරි බලය සතු ප්‍රධානතම ආයතනය වනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි.**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උරුම කළමනාකරණය වඩාත් සක්‍රීය මට්ටමකට ගෙන ඒම වෙනුවෙන් සිය ආයතනික ව්‍යුහය විවිධ දිශානතීන් ඔස්සේ ස්ථාපිත කර ඇත. ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා, රසායන සංරක්ෂණ, ප්‍රකාශන ආදී ලෙස ශාස්ත්‍රීය සේවාවන් ආයතනය තුළ ස්ථාපිත කරමින් මහජනතාව වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි.**

**2013 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැගූ සුවිශාල ව්‍යාපෘති ප්‍රමාණය 600 ඉක්මවයි. යථෝක්ත දැවැන්ත ව්‍යාපෘති අතුරින් කිහිපයක් පමණක් පළාත් මට්ටමින් මෙලෙස පෙළ ගස්වමු.**

## බස්නාහිර පළාත

බස්නාහිර පළාතේ 2013 වසරේ ජූලි මස සිට 2014 වසරේ ජූනි මස දක්වා ක්‍රියාත්මක කළ සමස්ථ ව්‍යාපෘති සංඛ්‍යාව 40කට අධික සංඛ්‍යාවක් වූ අතර ඉන් 30කට වැඩි ප්‍රමාණයක් 70% කට අධික ප්‍රගතියක් ලබා ගෙන ඇත. එකී ව්‍යාපෘතීන් අතරින් තෝරාගත් ව්‍යාපෘතීන් කිහිපයක් පිළිබඳ තොරතුරු පහත පරිදි වෙයි.

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානසඩ දෙවොල්කන්ද කේන්ද්‍ර කොටගෙන සිදුකරන ලද මෙම ගවේෂණය මගින් අදාල ප්‍රදේශයේ කළුගල ආශ්‍රිතව ඓතිහාසික හා යටත්විජිත යුගයේ ජනාවාස ලක්ෂණ හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය කරගත හැකි විය. මීට අමතරව ලේඛනගත කිරීම හා ගල් වලවල් පරීක්ෂා කිරීමද සිදුකරන ලදී.

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කෝට්ටේ නගර සීමාව තුළ පිහිටි පැරණි කොටු බැම්මට මැදිව ඇති ප්‍රදේශයේ අලකේශ්වර නටබුන් සහිත පුරාවිද්‍යා භූමියට යාබද භූමියේ නව නිවසක් ඉදිකිරීමට පෙර නිරවුල් සහතිකයක් ලබාදීම සඳහා අදාල භූමිය පරීක්ෂාවට ලක්කිරීමේදී පැරණි පෙති උළු දක්නට ලැබු



මිල්ලනිය, දෙල්ගොඩ,ගොඩෙවත්ත ශ්‍රී බෝත්තාරාම විහාරය

හෙයින් කැණීම් කටයුතු සිදුකරන ලදී. එහිදී කබොක් ගල් අත්තිවාරම, විශාල වශයෙන් මැටි බඳුන් අවශේෂ, කොකුඇණ, මෝස්තර සහිත පෙති උළු වර්ග, අතුරු, පැරණි ගඩොල් හමුවිය.

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වස්කඩුවේ පිහිටි ශ්‍රී සුභූති මහාවිහාරය රාජගුරු වස්කඩුවේ ශ්‍රී සුභූති මහා නාහිමිපාණන් වහන්සේ වැඩවිසූ ආරාමයකි. ශ්‍රී සුභූති මහා නා හිමියෝ වැඩ විසූ කුටිය හා උන්වහන්සේ පරිහරණය කළ භාණ්ඩ සංරක්ෂණය කොට ඒවා මහජන ප්‍රදර්ශනයට තැබීමට හා උක්ත කුටිය තොරතුරු මධ්‍යස්ථානයක් ලෙසට පරිවර්තනය කිරීම උදෙසා ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශන පුවරු සඳහා විදුලි බල්බ සවි කිරීමද මෙම වසරේ සිදුකරන ලද නවත් ව්‍යාපෘතියකි.

ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාබොඩල පිහිටි ක්ෂේත්‍රාරාම විහාරයේ සීමාමාලකය හා ආවාසගෙය සංරක්ෂණය සාර්ථක ලෙස නිමකරන ලද ව්‍යාපෘතීන් වෙයි. මෙහි සීමා මාලකය දෙමහල් ගොඩනැගිල්ලක් වන අතර , වහලය සම්පූර්ණයෙන්ම සංරක්ෂණය කරන ලද අතර, වහලය සඳහා අවශ්‍ය දැව විහාරාධිපති හිමියන් විසින් සපයන ලද අතර, ආවාස ගෙයිද සම්පූර්ණ සංරක්ෂණ වැඩ අවසන් කරන ලද අතර , ඒ සඳහාද අවශ්‍ය දැව ද විහාරාධිපති හිමියන් විසින් සපයන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහලගම වැම්පිට විහාරය මහනුවර යුගයේ චිත්‍ර සහ පිළිමවලින්



පැරණි සීමා මාලකය

සමන්විත වූ වහලය සම්පූර්ණයෙන්ම සංරක්ෂණයකර මාළිගා උළු සෙවිලි කරන ලදී. මෙයද මෙම වසරේ නිමකල ව්‍යාපෘතියකි.

කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වරකාගොඩ බටහිර ග්‍රාම නිලධාරි වසමේ සල්ගස් හාවත්ත, වෙහෙරගොඩ ප්‍රදේශයේ තිබූ පැරණි දාගැබක නටබුන් සහිත ප්‍රදේශය 2007 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කැණීම් කළ අතර එමගින් දාගැබෙහි පැරණි පේසාවන් හා ගඩොල් බැමි මෙන්ම වටේට වූ ඉහිගල් බැම්මේ කොටස් ද මතුකර ගැනීමට හැකිවිය. අනතුරුව 2013 වසරට මෙම ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කල අතර ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ සංරක්ෂණ කටයුතුවල නියුතු පුහුණු හා නුපුහුණු ශිල්පීන් යොදවා මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

ඒ අනුව වට ප්‍රාකාරය ලෙස ඇති ඉහිගල් බැම්ම පැරණි ආකාරයට සංරක්ෂණය සඳහා ඉහිගල් ප්‍රදේශයෙන් සොයාගෙන එම කාර්යය ඉටු කිරීමට මහත් වෙහෙසක් දැරිය. මෙම ස්ථානයේ කැණීමෙන් මතු වූ නිධන් කූටිය අසලින් නිධන් වස්තූන් තැම්පත් කිරීමට ගනේඋඩ පුරාණ රජමහා විහාරයේ විහාරාධිපති හිමි ඇතුළු ප්‍රදේශවාසීන් විසින් සිදුකළ අතර ඉන් අනතුරුව අලුතින් ගෙනෙන ලද ගඩොල් යොදා දාගැබේ මැද හාරා තිබූ කොටස් සංරක්ෂණය කරන ලදී. අනතුරුව පැරණි පේසාව හා බැමි කොටස් හැකිතාක් දුරට ඉතිරි වන පරිදි අලුතින් ගඩොල් යොදා එහි තිබූ සාධක උපයෝගී කරගෙන සංරක්ෂණ සැලැස්මට අනුව කොට වෙහෙරක ආකාරයට මෙම දාගැබ සංරක්ෂණය කරන ලදී.



පහලගම වැම්පිට විහාරය



වෙහෙරගොඩ දාගැබ සංරක්ෂණයෙන් පසු



දෙහිවල සුබෝධාරාම විහාරස්ථානයේ ආවාසගෙය

කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙමටගොඩ පිහිටි පධානඝර විහාරයට අයත් පැරණි ආවාසගෙයි වහලය සංරක්ෂණය කිරීම මෙම වසරේ අවසන් කරන ලද නවත් ව්‍යාපෘතියකි. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බොරලැස්ගමුවේ පරමධම්ම පිරිවෙණ පිහිටා ඇත. විශාල ප්‍රමාණයේ ආවාසගෙයි වහලය සංරක්ෂණය කොට අවසන් කිරීම මෙම වසරේ ක්‍රියාත්මක කළ සංරක්ෂණ ව්‍යාපෘතියකි.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙහිවල පිහිටි සුබෝධාරාම විහාරයේ පැරණි ආවාසගෙය වහලය, බිත්ති හා සිවිලිම සංරක්ෂණය කළ අතර ගෙබිමට බිම්ගල් ඇල්ලීම හා දොර ජනේල අළුත්වැඩියාව , පින්තාරු කිරීම ද මෙම ව්‍යාපෘතියේ දී සිදුකරන ලදී. සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය දැව, බිම්ගල් හා බිම්ගල් ඇල්ලීමට සිමෙන්ති ගරු විහාරාධිපති වහන්සේ ලබාදී ඇත.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාලිගාකන්දේ පිහිටි විද්‍යෝදය පිරිවෙණේ පැරණි ගොඩනැගිල්ලක් වන පුස්තකාල ගොඩනැගිල්ල බිඳා බැසීමේ තර්ජනයට ලක්ව තිබූ හෙයින් එම තත්වය මඟහරවාගැනීම පිණිස අවශ්‍ය ඉංජිනේරු උපදෙස් අනුව අවශ්‍ය වාස්තු විද්‍යාත්මක සංරක්ෂණයක් මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී.


කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පනාවත්ත පිහිටි පැරණි පොකුණ සංරක්ෂණ වැඩ 2013 නොවැම්බර් මස ආරම්භ කරන ලදී. මෙහි සංරක්ෂණ වැඩකටයුතු කෙරෙමින් පවතී.

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බිලගොඩුව පිහිටි ජයවර්ධනාරාම පුරාණ විහාරයේ වහලය හා බිත්ති සපරාරුව සංරක්ෂණය මේ යටතේ සිදුකරන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ



බලගොඩුව විහාරය



පනාවත්ත පැරණි පොකුණ සංරක්ෂණය කරමින්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගම්පල පිහිටි පැරණි පොකුණ වටා වූ කළුගල් බැම්ම සංරක්ෂණය මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී.

ඉහත දැක්වූ ව්‍යාපෘතිවලට අමතරව බස්නාහිර පළාතට අයත් කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි ස්ථාපිත කර ඇති කලාප 06 ට අයත් පුරාවිද්‍යා ස්ථාන දෛනිකව නඩත්තුකර පවත්වාගෙන යමි, නමින් ව්‍යාපෘතින් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මේ යටතේ කෝට්ටේ කොටු බැම්ම හා ඒ ආශ්‍රිතව ඇති අලකේශ්වර පුරාවිද්‍යා ස්ථානය, බැද්දගන පුරාවිද්‍යා ස්ථානය වැනි පුරාවිද්‍යා ස්ථාන ද, පිළිකුත්තුව ලෙන් විහාර සංකීර්ණය, බණ්ඩාරගම පනාවත්ත, වරකාගොඩ ගණේදෙව පුරාවිද්‍යා ස්ථානය වැනි පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිතව ඇති ස්මාරක නඩත්තුකර පවත්වාගෙන යාමට හැකිවිය.

✍ මහින්ද කරුණාතිලක,
වැ.ආ.සහකාර අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, බස්නාහිර.

## දකුණු පළාත

ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙන් සමන්විත දකුණු පළාත් පුරාවිද්‍යා බල ප්‍රදේශය තුළ 2013 වසරේ ගවේෂණ, කැණීම්, කෞතුකාගාර, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ, නඩත්තු හා ප්‍රවර්ධන යන අංශ ප්‍රධාන කොටගෙන ව්‍යාපෘතීන් ගණනාවක් සාර්ථකව ක්‍රියාවට නංවන ලදී.

ගවේෂණ අංශය මගින් පුරාවිද්‍යා ස්මාරක දත්ත වාර්තා කිරීම් අනුව දෙවිනුවර දේවාලය ආශ්‍රිත මුද්‍රිත ගවේෂණයට අමතරව ඛණිජ කැණීම් සඳහා බලපත් නිකුත් කිරීම උදෙසා ස්ථාන පරීක්ෂා කොට නිර්දේශ ලබා දීම, අනවසර කැණීම් පරීක්ෂා කිරීම හා නීති කටයුතු සිදු කිරීම, සංවර්ධන ව්‍යාපෘති හා සමගාමීව සිදුකෙරෙන පුරාවිද්‍යා හානි ඇගයීම, පුරාවස්තු විනාශයන් වාර්තා කිරීම හා නීති කටයුතු කිරීම යන කාර්යයන් වසර මුළුල්ලේම සිදු කරන ලදී.

කැණීම් අංශය මගින් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ වීරකැටිය හයිගල විහාරය පැරැණි ගොඩනැගිල්ල කැණීම් සිදු කරන ලද අතර පොදු කැස්පත් යටතේ අකුණුගල්ල ගල්වෙහෙර මඩවත්ත විහාරයේ පිළිමගෙය කැණීම් කරන ලදී.

කෞතුකාගාර අංශය යටතේ යටාල පුරාවිද්‍යා කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කරන ලද අතර මාතර තාරකා කොටුව කෞතුකාගාරය දෛනිකව නඩත්තු කරමින් ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යන ලදී.

රසායන සංරක්ෂණ අංශය මගින් කරාපිටිය සුනන්දාරාම විහාරය, මුල්කිරිගල රජමහා විහාරය, මාතර කොටමුණ ජයමහා විහාරය, වලමිල්දෙනිය ලෙන් විහාරය, පොල්වත්ත රන්පත් විහාරය, තුවක්කුගලවත්ත විහාරය, දොඩන්දූව ශෛලබිම්බාරාමය හා රදාවෙල අත්තදස්සාරාමය යන ස්ථානවල සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘතීන්ට අදාල කටයුතු සිදු කරන ලදී. එසේම ගාල්ල කොටු බැම්මේ වල්පැලෑටි මර්ධනය සඳහා රසායනික ප්‍රතිකාර්ම යොදන ලදී.

වාස්තු විද්‍යා අංශය මගින් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ කඹුරුගමුව ගොඩකන්ද සමුද්‍රගිරි විහාරය, විජයානන්ද පිරිවෙණේ ධර්ම ශාලාවේ ගෙබිම, කඹුරුපිටිය



සපුගොඩ විද්‍යාභිශේඛන විහාරයේ විහාරගෙය, සිතුල්පව්ව පැරැණි පොකුණේ පැති බැම්ම, වැල්ලබඩ අම්බලම සංරක්ෂණය හා වීරකැටිය හයිගල විහාරයේ දන්තධාතුව සඟවා තිබූ ශෛලමය ආධාරකය සඳහා ආධාරකයක් සකස් කිරීම යන ව්‍යාපෘතීන් ඉටු කරන ලදී. එසේම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ බූස්ස සුදර්ශනාරාමයේ ආවාසගෙය, පොල්වත්ත රන්පත් විහාරයේ ආවාසගෙය, මාතර අපරැක්ක ශ්‍රී මහිරතනාරාම විහාරයේ විහාරගෙය, පොල්වත්ත ගංගාරාමය විහාරයේ සංඝාවාසය හා දාන ශාලාව, දොඩන්දූව සිරිපියරතන විද්‍යාලයේ ගොඩනැගිල්ල, කොග්ගල සුදර්ශනාරාමයේ විහාරගෙය, මුල්කිරිගල ලෙන් විහාර 4 සහ ආවාසගෙය සංරක්ෂණය කරන ලදී. එසේම දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ ආණ්ඩුකාර නිල නිවසේ ආලින්දයේ වහලය සංරක්ෂණය හා රේගු දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගොඩවාය සෙල්ලිපිය සඳහා ආවරණයක් යෙදීම සිදුකරන ලදී.

නඩත්තු අංශය යටතේ කලාප අංක 01 (හික්කඩුව) මගින් කොස්ගොඩ ගනේගොඩැල්ල විහාරයේ පිළිමගෙයි වහල සැකසීම, බලපිටිය සුභද්‍රාරාම විහාරයේ පිළිමගෙයි වහල සැකසීම, බෙන්තොට ගලපාත විහාරයේ පිළිමගෙය අලුත්වැඩියා කිරීම යන ව්‍යාපෘතීන්ද, කලාප අංක 03 (ගාල්ල කොටුව විශේෂ කලාපය) මගින් කළු කොටුව නඩත්තු කිරීම හා ප්‍රාදේශීය කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ද, කලාප



අංක 04 (මාතර) මඟින් තාරකා කොටුව කෞතුකාගාරයේ වහල අලුත්වැඩියා කිරීම ද, කලාප අංක 05 (කටුවන/කසාගල) මඟින් රත්න සඟදාව විහාරයේ ප්‍රතිමා ගෘහය සඳහා උඩපළු යෙදීම, හයිගල පුරාවිද්‍යා ස්ථානයේ නාග පොකුණ වටා යකඩ වැටක් ඉදිකිරීම, හයිගල පුරාවිද්‍යා ස්ථානය නඩත්තු කිරීම, ගල්කෙමේ විහාරයේ ගල්පඩිපෙළ නඩත්තු කිරීම, වීරකැටිය සියල ටැම්පිට විහාරයේ නඩත්තු කටයුතු හා කසාගල දාගැබේ හුණු ආලේප කිරීම ද, කලාප අංක 06 (හම්බන්තොට) මඟින් පඩිකෙමිගල පුරාවිද්‍යා ස්ථානයේ පෙත්මං සැකසීම හා චිති බෝධිඝරයේ බැමි පොයින්ට් කිරීම, යහන්ගල පුරාවිද්‍යා ස්ථානයේ පෙත්මං සැකසීම හා දාගැබේ හුණු පිරියම් කිරීම ද, කලාප අංක 07 (තිස්සමහාරාමය) මඟින් සිතුල්පව්ව රජමහා විහාරයේ ගල් පඩිපෙළ හා පිළිම ආවරණ සැකසීම, යටාල දාගැබේ හුණු ආලේප කිරීම හා සිතුල්පව්ව විහාරයේ ඉලුනාග, වසභ, ගජබාහු රජවරුන්ට අයත් සිරිලිපි, යහන්ගල, හයිගල සිරිලිපි 2, මුල්ගිරිගල ලිපි 2, බෙන්තර ගලපාත විහාරයේ සිරිලිපිය යන සෙල්ලිපිවල පරිවර්තන පුවරු සඳහා ආධාරකාවලුක සවිකිරීම සිදුකරන ලදී. එසේම දකුණු පළාතේ කලාප 07ට අදාලව කලාප පවත්වාගෙන යාම වසර පුරා සිදුකරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ තුලේ පැරැණි වෙළෙඳ මධ්‍යස්ථානයේ වහලය අලුත්වැඩියා කිරීම, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සමුද්‍ර කෞතුකාගාරයේ ප්‍රවේශ දොර සකස් කිරීම හා බුද්ධශාසන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හත්මහ කැබිලියපොල විහාරයේ විහාරගෙය ප්‍රතිසංස්කරණය කරන ලදී.

දකුණු පළාත් ප්‍රවර්ධන අංශයේ මූලිකත්වයෙන් ක්‍රියාවට නැංවූ ව්‍යාපෘතීන් කිහිපයක් වේ. ඒ අනුව 2013 පුරාවිද්‍යා සතියට සමගාමීව පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ශ්‍රමදාන හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශන මාලාවක් පවත්වන ලදී. එහිදී පොල්වත්ත රන්පත් විහාරය, මීගිරිපැන්න අරියාකර විහාරය, යහන්ගල පුරාවිද්‍යා ස්ථානය මූලික කරගෙන ශ්‍රමදානයක් හා පල්ලෙමලල මහා විද්‍යාලය, මීගිරිපැන්න ධර්මරතන විද්‍යාලය, වැලිගම ශ්‍රී සුමංගල විද්‍යාලය, තිස්ස මහා විද්‍යාලය, කහඳුව මහා විද්‍යාලය මූලික කරගෙන පාසල් දැනුවත් කිරීමේ පුරාවිද්‍යා දේශනයන් පැවැත්වීම හා පුරාවිද්‍යා සංගම් පිහිටුවීම සිදුකරන ලදී.



මේ අනුව දකුණු පළාත් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය 2013 වසර පුරා දකුණු පළාතේ පුරාවිද්‍යා උරුමයන් හඳුනා ගනිමින්, මනුකාර ගනිමින්, ආරක්ෂා කර ගනිමින් ඉදිරි පරපුර සඳහා ඵලදායී ලෙස යොදා ගැනීමට මංපෙත් විවර කරදීමට කැපවීමෙන් කටයුතු කරන ලද බව සතුටින් දන්වා සිටිමි.

✍ ඒ.ඩී.එම්.ඩබ්.කේ.කේ.
අලහකෝන්,
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (දකුණ)

## වයඹ පළාත

වයඹ පළාත් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මඟින් 2013 වසරේදී පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

ගවේෂණ අංශය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 10 ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලද ගවේෂණයේදී මූල ඓතිහාසික යුගයට අයත් සුසාන භූමියක සාධක හඳුනාගෙන ඇත. නවගත්තේගම අන්දර වැව ප්‍රදේශයෙන් හමු වූ මෙම භූමියේ සොහොන් 25 ක පමණ සාධක හා ඒ ආශ්‍රිත ජනාවාස සාධක, ටෙරාකොටා නිර්මාණ ආදිය ආවරණය වී ඇත. ඊට අමතරව මෙම ප්‍රදේශයෙන් අනුරාධපුර යුගයට අයත් ගොඩනැගිලි සාධක, හම් වැව්වල තරඹුන් ආදියද හඳුනා ගැනීමට හැකි විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් වන අරංකැලේ පුරාවිද්‍යා භූමිය ආශ්‍රිත ප්‍රදේශයේ ඇති අනෙකුත් පුරාවිද්‍යා නෂ්ටාවශේෂ හඳුනා ගැනීමේ අරමුණින් ගවේෂණ කාර්යයක් දියත් කරනු ලැබීය. අරංකැලේ ආශ්‍රිතව පිහිටි උඹනන්ද, මඩුනන්ද, බණ්නැග්ගම හා ඇහැටුගස්වැව ප්‍රදේශ ගවේෂණයට ලක් කෙරිණි. මෙම ගවේෂණ ව්‍යාපෘතිය මඟින් ස්මාරක 107 ක් පමණද, චංචල පුරාවස්තු 41 ක් පමණ ද හඳුනාගෙන ඇත. ස්මාරක අතර කටාරම් සහිත හා රහිත ලෙන්, ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ස්ථානයන්, පධානඝර, චංකමණාගාර, පෙත්මං, ජන්තාඝර, විශාල හා කුඩා පොකුණු ආදියද අනාවරණය කර ගැනීමට හැකි විය. වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මඩවල පුරාණ විහාරස්ථාන භූමිය ආශ්‍රිතව සිදු කෙරුණු ගවේෂණ කාර්යය 2013 වසරේ සිදු කෙරුණු විශේෂිත ව්‍යාපෘතියකි. මෙයට අමතරව ගවේෂණ අංශය මඟින් අනවසර කැණීම් ස්ථාන හා කළුගල් කැණීම් ස්ථාන පරීක්ෂා කිරීම වාර්ෂික ව්‍යාපෘතියක් ලෙස සිදු විය.



නිකවැරටිය දළුක්ගොල්ල ටැම්පිට විහාරය සංරක්ෂණය අතරතුර



සංරක්ෂණයට පසු

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මඟින් ව්‍යාපෘති 10 ක් සාර්ථකව නිම කරන ලදී. ඒ අතර, නිකවැරටිය දළුක්ගොල්ල ටැම්පිට විහාරය, කුරුණෑගල වරද්දන ශ්‍රී සුදර්ශනාරාම විහාරයේ පිළිමගෙය, හිංගිරිය කඩිගමුව විහාරයේ පොත්ගුල සංරක්ෂණය කිරීම යන ව්‍යාපෘති 3 ද 2014 දක්වා කිරුණු ව්‍යාපෘතියට සමගාමීව කටුපොත මොනරාගල විහාරය, ඇඹුල්ගිරි විහාරයේ ටැම්පිට විහාරය, හාරම්මිල වහරේගම රජමහා විහාරයේ ලෙන් විහාරය, ඇත්කරුව විජයසුන්දරාරාමයේ සංඝාවාසය, කොළඹගම විහාරය හා පුත්තලම විළුදගොඩ ලෙන් විහාරය සංරක්ෂණය කිරීම යන ව්‍යාපෘති 06 ක් රුස්වෙහෙර පුරාවිද්‍යා ස්ථානයේ සංරක්ෂණ කටයුතු ද වේ. ඇහැටුවැව රුස්වෙහෙර ශිලාමය බුද්ධ ප්‍රතිමාව ඉදිරිපස කැණීම් කරන ලද පිළිමගෙය සංරක්ෂණය, ගුගේගොඩ උඩහමුල්ල පාමර් පදිංචි දයා පතිරගේ මහතාගේ පෞද්ගලික ධන පරිත්‍යාගය මත සිදු කිරීම විශේෂිත වේ.



රුස්වෙහෙර පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණයට පෙර සහ පසු

නඩත්තු කලාප 09 මගින් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක ද්වය ආවරණය වන පරිදි පුරාවිද්‍යා ස්ථාන විශාල ප්‍රමාණයක නඩත්තු කටයුතු සිදු කරන ලදී. ඒ අතර පෙත් මං සැකසීම, යටි කැලය කැපීම, ප්‍රාකාර නඩත්තුව ආදිය මගින් පුරාවිද්‍යා ස්ථාන ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

පුරාවිද්‍යා ස්ථාන 06 ක් සඳහා ශිලා ලේඛන පරිවර්තන වලක යෙදීම අභිලේඛන අංශය මගින් සිදු කෙරුණු අතර ස්ථාන 05 ක පුවරු සවි කිරීම සිදු කර ඇත. පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානයේ නිශ්ශංකමල්ල සෙල්ලිපිය, ඊදී විහාර භූමියේ සෙල් ලිපි 02, නිකවැරටිය මුදුමුත්තාව විහාරයේ ටැම් ලිපිය හා ගල්ගමුව කල්ලංචිය පුරාවිද්‍යා ස්ථානයේ සෙල් ලිපිය ඒ අතර වේ.

නාණක විද්‍යා අංශය මගින් පඬුවස්නුවර කෞතුකාගාරයේ සිඹු කාසි සුචිගත කිරීමේ කාර්යය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රවර්ධන අංශය මගින් පුරාවිද්‍යා සතියට සමගාමීව පඬුවස්නුවර, අරංකැලේ, යාපහුව, දෝහිගල හා කල්පිටිය ඕලන්ද පල්ලිය යන පුරාවිද්‍යා ස්ථානවලට පාසැල් ළමුන් හා මහජනතාව එක්රාශි කර පුරාවිද්‍යාව, පුරාවස්තු විනාශය හා පුරාවස්තු ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර පුරාවස්තු ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකය හා සම්බන්ධ වී දෙපාර්තමේන්තු සම්පත් දායකත්වයෙන් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් 20 ක් පමණ ක්‍රියාත්මක කෙරිණ.

කෞතුකාගාර පවත්වාගෙන යාමේ කටයුතු වාර්ෂිකව සිදු වූ අතර කෞතුකාගාර අංශය මගින් පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ ලේඛනගත කිරීමේ කාර්යය සිදු කරන ලදී.

වයඹ පළාත් කාර්යාලයට අනුබද්ධ රසායන සංරක්ෂණ අංශය මගින් පුරාවිද්‍යා ස්ථාන 11 ක් සඳහා මැදිහත්වීම් සිදු කර ඇත. ඒ අතර, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හොම්බදියගල ලෙන් විහාරය, තුඹුල්කඩුල නිල්ගිරිය, මහව දියබැටේ විහාරය, නිකවැරටිය හලම්ගල විහාරය, හාරම්මල දම්ඉදෙනිය ශ්‍රී විජයසුන්දරාරාම දෙමහල් පිළිමගෙය, දැහැව මහාලුහි විහාරය, ඹමුණකොටුව කාටාගේ පුරාවිද්‍යා ස්ථානය, අලව්ව තුම්බුළුවව විහාරය, මෝරගම විහාරය, කුලියාපිටිය කුඹුල්වල පුරාණ විහාරයේ පිළිමගෙය යන ස්ථානවල බිතුසිතුවම් සංරක්ෂණයට හා වේ නාශක යෙදීමට ක්‍රියා කරන ලදී.

✍ එස්. ඒ. ටී. පී. ප්‍රියන්ත
සහකාර අධ්‍යක්ෂ (වැ.ආ.)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
හෙට්ටිපොළ, පඬුවස්නුවර.

## ඌව පළාත

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් 2013 වසර තුළදී පළාතේ ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීමෙහි ලා සුවිශේෂී වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි වැඩසටහන් මාලාවේදී අතීත උරුමයන් හඳුනා ගැනීම, ලේඛන ගත කිරීම හා විනාශ වෙමින් පවතින ස්ථාන හඳුනාගෙන ආරක්ෂාව සඳහා පිළියම් යෙදීම, ඇතුළුව පළාතේ ජාතික උරුමයන් සෙට දවස සඳහා ආරක්ෂිතව රැකබලා ගැනීම උදෙසා වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.





මේ අතර ඌවේ අතීත උරුමයන් සොයා යාම සහ ලේඛන ගත කිරීමේ කාර්යයේදී පැරණි බදුල්ල නගරයේ පෞරාණික ස්ථාන හඳුනා ගැනීම, ගෝවින්දහෙළ පුරාවිද්‍යා භූමිය ගවේෂණය හා පළාතේ පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ස්මාරක ලේඛනගත කිරීම ඇතුළුව පුරාවිද්‍යා අනාවරණ කැණීම් පරීක්ෂා කිරීම, පුරාවස්තු සොරකම් වාර්තා කිරීම්, පළාතේ සංවර්ධන ව්‍යාපෘති හා සමගාමීව සිදුකෙරෙන පුරාවිද්‍යා හානි ඇගයීම් ගවේෂණ, ගල් විදුම් හා ඛනිජ කැණීම් සඳහා ස්ථාන පරීක්ෂා කොට නිර්දේශ ලබාදීම ඇතුළු කාර්යයන් රැසක් ගවේෂණ හා ලේඛනගත කිරීමේ කාර්යයන් ආශ්‍රිතව සිදුකරන ලදී.

මුව විහාර භූමියේ උසම ස්ථානයේ ස්තූපය ඉදිකර ඇත. මෙම ස්තූපය කැණීම් සිදුකිරීමෙන් පැරණි දාගැබ මතුකරගැනීම හා 36 ප x 36 ප දිග පළලින් යුතු ප්‍රාකාර බැම්මක් හා පිවිසුම් පඩිපෙළ මතුකර ගැනීමට හැකිවිය. විවිධ මැටි බඳුන් කැබලි දැකුම් කළු පැත්තෙන්ඩියක්, පබළු, පළිඟු කරඬුවක් ටෙරාකොටා මුදු පිළිම පුවරු, ටෙරාකොටා මැටි කොත් කැණීමෙන් සොයාගත් විශේෂ පුරාවස්තු වාර්තාගත විය.

වාස්තු විද්‍යා සංරක්ෂණ ක්‍රියාවලිය යටතේ බදුල්ල - මොණරාගල දිස්ත්‍රික්කය ආශ්‍රිතව



පළාත තුළ පුරාවිද්‍යා ස්මාරක කැණීම්කර අනාවරණය කිරීම යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හම්බේගමුව පුරාණ විහාරයේ දාගැබ කැණීම් කටයුතු සිදුකරන ලදී.

7වන සියවසට පමණ අයත් පබ්බතාරාම විහාර සම්ප්‍රදායට අයත් යැයි සැලකෙන හම්බේග



මුතියංගණ රජමහා විහාරයේ ආවාසගෙය සංරක්ෂණය කොටසක් හා හම්බේගමුව විහාරයේ දාගැබ ආරක්ෂාවට පුරගෙය ඉදි කිරීම ආදිය විවිධ ආරක්ෂිත කුමෝපායන් තුළින් ඒ ඒ පුරාවිද්‍යා ස්මාරකවල සිදු ආරක්ෂාව වෙනුවෙන් කටයුතු සිදුකරන ලදී.

එයට අමතර වශයෙන් විශේෂ ව්‍යාපෘතියක් වූ යුධගනාව දාගැබ සංරක්ෂණ කටයුතු සමගාමී බාහිර ආයතන ආධාර යටතේ වූ මිණිකරණ දාගැබ සංරක්ෂණ කටයුතු අවසන් කිරීමත් මොණරාගල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්මාරක භූමි ආශ්‍රිත ධජ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සිදුකරන ලදී.

කර ඇති අතර 2012 වර්ෂයේ කැණීම්වලින් හමුවූ පුරාවස්තු සංරක්ෂණය කිරීම සඳහා දාගැබේ කවුළුවක් ඉදිකරන ලදී.

උරුමයන් ආරක්ෂාකර පවත්වාගෙන යාමේ කාර්යයේදී පළාතේ පවතින නඩත්තු කලාප 07 ට අයත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබූ අතර උඩහල විහාරයේ ප්‍රාකාර බැම්ම සැකසීම, සිංගිරිය පුරාවිද්‍යා ස්ථානය, කසාලිය පුරාවිද්‍යා ස්ථානය, සෙල්ලබාව පුරාවිද්‍යා ස්ථානය නඩත්තු කර පවත්වාගෙන යාම ආදී වැඩසටහන් බොහෝමයක් ක්‍රියාවට නංවා ඒ ඒ ස්ථානවල ආරක්ෂාව සඳහා කටයුතු සිදුකර ඇත.



මෙයට අමතර ව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සමඟ එක්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කළ මහියංගන ආදිවාසි ජීවමාන ගම්මානයේ වෙද්දාසන ඇඹරුම්සල වහල සෙවිලි කිරීම හා ජීවමාන කෞතුකාගාරයේ වටකඩු යෙදීමක් සිදුකර 2013 වසරේදී අවසන් කරන ලදී.

පොදු පැන්පත් යටතේ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සංරක්ෂණ ව්‍යාපෘතියේ මූලික කටයුතු මෙවසර් දුරට අවසන් කරන ලදී.

මෙසී සියලු කාර්යන් තුළින් ජාතික උරුමයන් හඳුනාගෙන ආරක්ෂිතව පවත්වාගෙන යාම හා මහජනතාව දැනුවත් කිරීම සඳහා මාලිග ාවීල තොරතුරු මධ්‍යස්ථානය හා බුදුරුවයාල කෞතුකාගාරය පවත්වාගෙන යාම හා දැයෙහි උරුමය මතු පරපුර උදෙසා වූ අරමුණින් යුතුව මහජනතාව පාසැල් සිසුන් හා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ දේශන මාලාවක් ද පවත්වනු ලැබීය.

මේ අනුව 2013 වසර තුළ උඩවේ ජාතික උරුමයන් ආරක්‍ෂා කිරීම මෙන්ම ඒවා පොදු මහජනතාව වෙත බද්ධ කිරීමෙහිලා සුවිශේෂී කාර්ය භාරයක් ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් සාර්ථකව ඉටුකරන ලද බව සතුටින් දන්වා සිටිමු.

✍ ඩී.ඩී. විජේපාල
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඌව)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, බදුල්ල.

## උතුරු මැද පළාත

2013 වර්ෂයේ උතුරු මැද පළාතේ කැණීම් දත්ත විශ්ලේෂණ අංශය මගින් දාගැබ් 03 ක් සිදුකළ අතර, මෙයින් විශේෂිත ස්ථානයක් හිමිවනුයේ අනුරාධපුර මහා විහාරාරාමවලට



පිරිහිත් වූ විශාල දාගැබක් වන අනුරාධපුරයට දකුණින් පිහිටි නවාගල දාගැබ කැණීම හඳුන්වා දිය හැකිය. මෙම දාගැබ කැණීම මගින් අවධි ගණනාවක සාධක ලැබුණු අතර, එමගින් අවධි 03 ක සාධක පැහැදිලි ලෙස හඳුනාගැනීමට හැකියාව ලැබුණි. මෙමගින් එක් එක් අවධිවලට අයත් පුරාවස්තු රාශියක් ද හමු විය. මේ අතරින් විශේෂත්වයක් හිමි වනුයේ දෙවන අවධියට අයත් දාගැබේ ගරාවැටීම තුළ තිබූ මැටි කරඬුව තුළ පැත්පත් කර තිබූ රන් පැහැති කරඬුව හා දාගැබෙහි මධ්‍යම පාත්ලේ කාර්තුවකින් හමු වූ ගල් කරඬුව හා ඒ තුළ වූ ධාතු මංජුසා විශේෂ වැදගත්කමක් හිමි වේ. එමෙන් ම මෙම දාගැබ තුළින් ක්‍රි.ව. 02 - 04 කාලයට අයත් යැයි සැලකිය හැකි ගර්භය තුළ වූ චිත්‍ර ද මෙතෙක් දාගැබ කැණීමකින් හමු නොවූ ඉතා විශිෂ්ට ශිල්පීය නිර්මාණයක් ද හමු විය. මෙම දාගැබේ පළමු අවධිය ක්‍රි.පූ. යුගය දක්වා ගමන් කරනු ලබන අතර, වරින් වර සංවර්ධනය වෙමින් හා බිඳ වැටෙමින් පැවත 10 වන සියවසේ අග අනුරාධපුර රාජධානියේ පරිහානියත් සමඟ මෙම ස්ථානයත් ද පරිහානියට ලක් වී ඇත.


කහටගස්දිගිලිය දුෂ්කර ගම්මානයක ඉතා රමණීය පරිසරයක පිහිටා ඇති හෙට්ටිකුළම විහාරාරාමය පදානඝර සම්ප්‍රදායට අයත් විහාරස්ථානයක් වන අතර මෙහි පිහිටි දාගැබ යූප ස්ථම්භ සහිත චතුවලින් යුතු දාගැබක් වශයෙන් තිබුණු බවට සාධක කැණීම් මගින් අනාවරණය කරගැනීමට හැකියාව ලැබුණි. මෙම දාගැබ කැණීමෙන් ද ලෝහමය කුඩා බුදු පිළිම දෙකක් හමු වූ අතර, මෙම ස්තූපය ද නිධන් හොරුන් විසින් හාරා විනාශ කර තිබුණි.

ත්‍රිකුණාමලය තිත්තියා උළුපිටිය ශ්‍රී ආරාම සංකීර්ණය ස්ථානයේ කැණීම් කටයුතු 2012 වර්ෂයේ අවසන් වර්ෂාව හේතුවෙන් නවතා තිබුණි. එම වර්ෂයේ දී මෙම ස්ථානයේ පිහිටි ගොඩැල්ල කැණීම් සිදුකළ අතර, එමගින් මෙම ස්ථානයේ දාගැබක සාධක සොයා ගැනීමට හැකි විය. ඒ අනුව මේ ස්ථානයේ පිහිටි අභියුක් ගොඩනැගිලි



සොයා ගැනීම සඳහා 2013 වර්ෂයේ පර්යේෂණ වළවල් කැණීම් සිදුකර ස්ථානයේ පිහිටි පිළිම ගෙයක සාධක හා එයට අයත් සඳහා කොටත් ආරාම සංකීර්ණයකට අයත් අවශේෂයන් හමු වූ අතර, මෙම ස්ථානයේ භික්ෂූන්ට අවශ්‍ය ජලය සපයා ගැනීම සඳහා පොකුණක් ද තිබී ඇති අතර, එය මේ වන විට විල්ලුවක් වශයෙන් පවතී. මෙම ස්ථානයේ ගිරි පිළිමයක් තිබූ බවටත් සාධක පවතී.

2013 වර්ෂය සඳහා සංරක්ෂණ අංශය මගින් ප්‍රධාන සංරක්ෂණ ව්‍යාපෘති කයක් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ වසර දහස් ගණනක් පැරණි මිහින්තලය ඉඳිකටු සෑ පරිශ්‍රයේ පිහිටි කළුගල් පොකුණු හා ප්‍රාකාර බැම්ම සංරක්ෂණය සඳහා පියවර ගන්නා ලදී. ඒ සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන දහයක මුදලක් වැය කරන ලදී. ඊට අමතරව මිහින්තලය මහ සෑ මළුවේ මුදුගෙයි වහලය රුපියල් මිලියනයක වියදමින් වැඩ අවසන් කරන ලදී. කලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටියාව ග්‍රාමයේ නවාගල දාගැබ සංරක්ෂණය ආරම්භ කරන ලදහ. දාගැබේ 03 ජේසාව දක්වා සංරක්ෂණය අවසන් කර ඇති අතර, ඉතිරි වැඩ 2014 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිත වේ. මේ සඳහා විහාරස්ථ දායක සභාව ද්‍රව්‍ය හා ශ්‍රමය ලබාදීමට කටයුතු කළහ. කහටගස්දිගිලිය හෙට්ටිකුළම නම්මැන්නා කන්ද විහාරස්ථානයේ පිහිටි ඉපැරණි දාගැබ සංරක්ෂණය සිදු කරන ලදී. විහාරස්ථ දායක සභාව විසින් ශ්‍රමය හා ද්‍රව්‍ය ආධාර සපයන ලද අතර, මේ සඳහා රුපියල් මිලියන 0.35 ක මුදලක් ඇස්තමේන්තු ප්‍රතිපාදනය යටතේ වැය කරන ලදී. මෙම දාගැබ සංරක්ෂණයේ දී පැරණි යුගයේ තිබූ යූප ගල හා චතුය පෙර තිබූ අයුරින් පිහිටුවා සංරක්ෂණය කිරීම වැදගත්කමක් ගනී. ප්‍රදේශවාසීන්ගේ ගුණයට හසු වීමෙන් විනාශ වී තිබූ පොළොන්නරුව මාණික්කම් පට්ටිය දාගැබ හා වේදිකා බැම්ම









සංරක්ෂණ කටයුතු ද 2013 වසර තුළ දී ම ආරම්භ කරන ලදී. ඒ සඳහා ද දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත රුපියල් මිලියන 113 ක් වැය කළ අතර, ඉතිරි සංරක්ෂණ කාර්යය 2014 වසරේ දී අවසන් කිරීමට නියමිත වේ.

තාක්ෂණ අංශය මඟින් 2013 වර්ෂය තුළ ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කරන ලදී. එහි දී වැඩබිම් 25 ක පමණ ප්‍රමාණයක් උද්‍යාන මට්ටමින් තාක්ෂණ කොට පවත්වාගෙන යාම, අත්‍යාවශ්‍ය තාක්ෂණ කටයුතු සිදුකිරීම හා පුරාවිද්‍යා ස්මාරක ස්ථානවල ආරක්ෂාව සැලසීම ආදී කටයුතු සිදු කළහ. මේ සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත රුපියල් මිලියන 3 ක පමණ මුදලක් වැය කරන ලදී. කාලාන්තරයක් තිස්සේ මහා මාර්ගයට යටව තිබූ අනුරාධපුර නගර ආශ්‍රිත පොළවල පුරාවිද්‍යා රක්ෂිතයේ ඉතා දිගු පෙත් මගෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 1.4 ක් වැය කරන ලදී. ප්‍රවර්ධන කටයු යටතේ ප්‍රදේශයේ පුහුණු පාසල්, අභ්‍යාස ආයතන, යුධ හමුදා පොලිස් පුහුණු විද්‍යාල, පාසල් ස්වේච්ඡා ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළහ. පුරාවිද්‍යා සංගම් 05 ක් හා ස්වේච්ඡා සිවිල් ආරක්ෂක කමිටු 10 ක පමණ පළාත තුළ 2013 වසරේ පිහිටුවීමට කටයුතු කළහ. එමෙන් ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් හා අධිකරණ කටයුතුවල නිරත පොලිස් නිලධාරීන් සඳහා පුරාවස්තු ආරක්ෂණ විශේෂ වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර, ඊට මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් සහභාගි විය.

✍ එස්.පී. චිත්‍රානි මල්කාන්ති
පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ (උතුරු මැද)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
අනුරාධපුරය.

## නැගෙනහිර පළාත

ඓතිහාසික වශයෙන් ක්‍රි.පූ. යුගය දක්වා දැනට විහිදී යන නැගෙනහිර පළාතේ මේ වන විට ප්‍රධාන ව්‍යාපෘති තුනක් (3) ක්‍රියාත්මක වේ. එනම්, දීඝවාපි දාගැබ සංරක්ෂණය, නීලගිරි දාගැබ සංරක්ෂණය හා සාගම කැණීම සංරක්ෂණය වේ. මෙම ව්‍යාපෘති නැගෙනහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලය මඟින් ප්‍රධාන කාර්යාලයේ මග පෙන්වීම යටතේ සිදුකර ගෙන යනු ලබයි.

### දීඝවාපි දාගැබ සංරක්ෂණය



අවිධිමත්ව ඉදිකර ඇති ගර්භය ඉවත් කිරීම

ක්‍රි.පූ. දෙවන (02) සියවස දක්වා අතීතයකට උරුමකම් කියන මෙම දාගැබ උස රියන් 185 ක් වේ. 1916 වර්ෂයේ දී කොහුකුඹුරේ රේවත හිමි විසින් මෙම ස්ථානය සොයා තම විහාරස්ථානය ලෙස පවත්වාගෙන යන ලද අතර 1970 දශකයේ මෙහි කැණීම් කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කෙරේණි. ඒ සඳහා පාසල් ළමුන්, ප්‍රදේශ වාසීන් යොදා ගත් බව සඳහන් වේ. නැවත 1978 වර්ෂයේ නැවත සංරක්ෂණ කටයුතු ආරම්භ කළ අතර එම කටයුතු කෙටි කාලයක් පමණක් පැවති අතර, නැවත 2010 වසරේ සංරක්ෂණ කටයුතු ආරම්භ කෙරිණි. ඉංග්‍රීසි පාලන සමයේ දාගැබ මැදින් කැණීම් කර අවිධිමත් අයුරින් සංරක්ෂණය කර තිබූ ගර්භය නැවත 2013 වර්ෂයේ කැණීම් මඟින් අඩි 59 ක් පමණ ගැඹුරට සිදු කර විධිමත් අයුරින් ගර්භ සංරක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතියි. 1978 වර්ෂයේ දාගැබේ ගර්භය අවිධිමත් අයුරින් සංරක්ෂණය කර ඇති බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ගර්භයේ කොටස් මේ වන විට ඉවත් කිරීමේ කටයුතු සිදු කරණු ලැබේ.

### නීලගිරිය දාගැබ සංරක්ෂණය



සංරක්ෂණය කෙරෙමින් පවතින ආකාරය

ලාහුගල ප්‍රදේශයට අයත් නීලගිරිය දාගැබ නැගෙනහිර පළාතේ විශාලත්වයෙන් දෙවැනි දාගැබ වේ. ක්‍රි.ව. 1-2 සියවස්වලට අයත් වන බවට පුරාවිද්‍යාත්මක සාධක මඟින් සනාථ වී ඇති මෙම දාගැබේ සංරක්ෂණ කටයුතු 1979 ආරම්භ කළ අතර, එල්.ටී.ටී.ඊ. ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් 1983 වසරේදී නතර කරනු ලැබීය. නැවත 2008 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ගවේෂණ කටයුතු සිදු කළ අතර, 2012 වසරේ මෙහි කැණීම් කටයුතු ආරම්භ විය. 2012 වසරේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය හා උපදෙස් මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය මඟින් දාගැබ සංරක්ෂණය සඳහා අවශ්‍ය කැණීම් කටයුතු ආරම්භ කෙරිණි. මෙම වසරේදී දාගැබ් ගර්භයේ ඉතිරි කැණීම් කටයුතු සිදු කරනු ලබන අතර, දාගැබේ පේසාවන්වල සංරක්ෂණ කටයුතු සිදු වෙමින් පවතියි.

### සාගම කැණීම හා සංරක්ෂණය





පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණයට ලක් නොවූ ස්ථානයක් වශයෙන් තිබූ සාගම 2012 වසරේ අවසාන කාර්තුවේ මුස්ලිම් හා දෙමළ ජනතාව විසින් බැකෝ යන්ත්‍රයක් යොදා දාගැබේ ගර්භය මැදින් බේසර් කරනු ලැබීය. මෙම සිදුවීම නැගෙනහිර පළාතේ පමණක් නොව ලංකාව පුරා මහත් ආන්දෝලනයට ලක් වුණු සිදුවීමක් විය. මෙහි වැරදිකරුවන් 2012.11.25 වන දින අත්අඩංගුවට ගන්නා ලදී. මෙම පසුබිම හමුවේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දාගැබේ සංරක්ෂණ කටයුතු 2013 වසරේ ආරම්භ කෙරිණි. තාවකාලික තට්ටාපලක් ඉදිකර දෙපාර්තමේන්තු සේවකයින් යොදවා සංරක්ෂණ කටයුතු ආරම්භ කළ නමුත් වන අලි තර්ජන හේතුවෙන් තාවකාලිකව නතර කෙරිණි. නැවත 2014 වසරේ දෙවන කාර්තුවේ සිට දාගැබ සංරක්ෂණ කටයුතු ඉතා කඩිනමින් සිදු කෙරෙමින් පවතියි.

✍ ඩබ්.එච්.ඒ. සුමනදාස
සහකාර අධ්‍යක්ෂ (නැගෙනහිර),
පළාත් පුරාවිද්‍යා කාර්යාලය, අම්පාර

## මධ්‍යම පළාත

ගවේෂණ, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ, කෞතුකාගාර තාක්ෂණ සහ ප්‍රවර්ධන යන අංශ මූලිකව මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක ත්‍රිත්වය ආවරණය වන පරිදි 2013 වර්ෂයේදී මධ්‍යම පළාත් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මඟින් ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලදී.

ගවේෂණ අංශය මඟින් මහනුවර මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගවේෂණය සාර්ථකව නිම කළ අතර එහිදී




ග්‍රාම නිලධාරි වසම් 93 ක් තුළ ප්‍රාග් ඓතිහාසික යුගය නියෝජනය කරන්නේයැයි උපකල්පනය කළ හැකි සාධක මෙන් ම නිශ්චිත වශයෙන් ම අනුරාධපුර යුගයේ සිට යටත් විජිත යුගය නියෝජනය කරන්නා වූ ස්ථාන 100 කට ආසන්න ප්‍රමාණයක් විධිමත් ලෙස වාර්තා කරන ලදී. එසේම මේ වන විට හඳුනාගෙන වාර්තාකර ඇති ස්මාරකයන්ගේ වර්තමාන තත්ත්වය හඳුනාගෙන එම ස්මාරකයන්ගේ චිර ජීවනය සඳහා මැදිහත් විය යුතු ආකාරය පිළිබඳව යෝජනාවලියක් සැකසීමත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් සංරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමත් ද ගවේෂණයේ මූලික පරමාර්ථය විය.

එසේම වංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය මඟින් මහනුවර කුළුගම්මන රජමහ විහාරස්ථානය භාරයේ පවතින කෞතුක වස්තු 150 ට ආසන්න ප්‍රමාණයක් විධිමත්ව වාර්තාගතකරණයෙන් ව්‍යාපෘතිය සාර්ථකව නිමාවට පත් කරන ලදී. ස්මාරක ලේඛනගත කිරීමේ 5 වැනි අදියර තුළ මධ්‍යම පළාතේ ඇති ස්මාරක 480 ක් පමණ ලේඛනගත කර ඇත. මීට අමතරව ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු යටතේ පුරාවිද්‍යා භූමි හා පුරාවස්තු සොරකම් වාර්තා කිරීම හා ඒවාට අදාළ නීතිමය කටයුතු, සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධව සිදු කෙරෙන පුරාවිද්‍යා හානි ඇගයීම හා ගල් බිඳුම් ස්ථාන පරීක්ෂා කොට නිර්දේශ ලබා දීම ඇතුළු තවත් කාර්යයන් රැසක් සිදු කරන ලදී.

වාස්තු විද්‍යා සංරක්ෂණ ක්‍රියාවලිය යටතේ මාතලේ අලුවිහාරය වහල සංරක්ෂණය, මාවතුපොළ පෙතිගේපිටිය ධර්මශාලාව සංරක්ෂණය, නියංගම්පාය විහාරයේ පිළිමගෙය සංරක්ෂණය, පැලව අම්බලපිටි දේවාලයේ වහල සහ සොල්දර පඩිපුව සංරක්ෂණය, ගැටඹේ සුසාන භූමියේ ඇලවී ඇති ස්මාරක තැවත සංරක්ෂණය යන ව්‍යාපෘතීන් අවසන් කර ඇත. එසේම ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනය යටතේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ මහනුවර වැල් බෝධිය සංරක්ෂණ කාර්යය අවසන් කර ඇත.

තන්තාන විහාරයේ ආවාස ගෘහය සංරක්ෂණ, දන්තුරේ රුම්පිට විහාරය සංරක්ෂණය, පිවුරුපිටිය විහාරයේ වහල හා ධර්මශාලාව සංරක්ෂණය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එසේම මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ මහනුවර සතරගම දේවාල සංකීර්ණයේ සංරක්ෂණය, හඩලාදෙනිය සංඝාවාස සංරක්ෂණය, කඩදොර ආවාසගෘහය සංරක්ෂණය යන ව්‍යාපෘති ද ක්‍රියාත්මක වෙමින් පවතී.

රසායන සංරක්ෂණ අංශය මඟින් මධ්‍යම පළාතේ පුරාවිද්‍යා ස්ථාන කිහිපයක සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අතර දඹුල්ල ලෙන් විහාරය, කළුවාන විහාරය, නියම්ගම්පාය විහාරය, ආඳාවල විහාරය, ගැරඬිමැඩිල්ල විහාරය යන විහාරස්ථානයන්හි සිදු කරන ලද සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘති ප්‍රමුඛය. මීට අමතරව සීගිරි සිතුවම් වාර්තාගත කිරීම, මහනුවර කෞතුකාගාරයේ පැරණි දැව කණු පහක් සංරක්ෂණය, යන ව්‍යාපෘති ද රසායන සංරක්ෂණ අංශය මඟින් අවසන් කරන ලදී. එසේම ඩී.එල්.සී.සී. බැංකුවේ ප්‍රතිපාදන යටතේ කෝපි වවන්නන්ගේ වතුර මල සංරක්ෂණය යන ව්‍යාපෘතිය ද, දේවාල භාරකාර ප්‍රතිපාදන යටතේ මහනුවර නාථ දේවාලයේ ජල කාණුව හා බිත්ති සෝදීම වැලැක්වීමේ ව්‍යාපෘතිය ද සාර්ථකව නිමා කරන ලදී.

2013 වර්ෂයේ මධ්‍යම පළාතේ උරුමය රැකබලා පවත්වාගෙන යාමේ කාර්යයේ දී පළාතේ පවතින නඩත්තු කලාප 11 නියෝජනය වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබූ අතර උඩගම් හාන ශ්‍රී විහාරය නඩත්තුව, වැලිවිට වේගොල්ල විහාරය අලුත්වැඩියා කිරීම, පුටුහපුව අම්බලමේ වහලය සැකසීම, සීගිරිය ක්ෂේත්‍ර නිවහන පවත්වාගෙන යාම හා අලුත්වැඩියා කිරීම, මහනුවර උල්පැන්නේ වහලය සැකසීම, මලල් මඩුව ප්‍රතිසංස්කරණය කිරීම, කුණ්ඩසාලේ සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම ඇතුළුව පුරාවිද්‍යා ස්ථාන රාශියක් ආරක්ෂිතව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

කෞතුකාගාර අංශය යටතේ මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරය අලුත්වැඩියා කිරීම හා නව ප්‍රදර්ශනය සැකසීම සිදු කරන ලද අතර, හාලුන්ද ජාතාරප කෞතුකාගාර හා පිදුරංගල වැඩ බිම් කෞතුකාගාරය දෛනිකව නඩත්තු කර ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

මධ්‍යම පළාතේ ප්‍රවර්ධන අංශයේ මූලිකත්වයෙන් ක්‍රියාවට නැංවූ ව්‍යාපෘති කිහිපයක් වේ. ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා බාහිර ආයතනවල නිලධාරීන් ඉලක්ක කර ගනිමින් පුරාවිද්‍යාත්මක කරුණු පිළිබඳ ශාස්ත්‍රීය දේශන මාලාවක් පවත්වන ලදී. 2013 පුරාවිද්‍යා සතියට සමගාමීව මධ්‍යම පළාත තුළ තෝරා ගත් පාසල් කිහිපයක දේශන මාලාවක් පැවැත්වූ අතර එම




පාසල් පුස්තකාල පරිහරණය සඳහා පොත් කට්ටලය බැගින් පිරිනමන ලදී.

එසේම මහනුවර නගරයේ පුරාවිද්‍යාත්මක ස්මාරක ආරක්ෂා කිරීම පිළිබඳව ස්මාරක හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ඊට අමතරව බාහිර ආයතනවලින් ලැබෙන ඉල්ලීම් සහ ආරාධනාවන්ට අනුව සම්පත් දායකයින් වශයෙන් දේශන පැවැත්වීම සිදු කෙරුණි.

✍ එල්.එම්. ගුණතිලක බණ්ඩා
සහකාර අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, මහනුවර.




## උතුරු පළාත

2013 වසරේ ඇරඹි සංරක්ෂණ සහ නඩත්තු ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කරන අතර ඇතැම් ඒවා සංරක්ෂණය කොට අවසන් කර ඇත. ඒ අතර යාපනය කොටුව සංරක්ෂණ කටයුතු ප්‍රමුඛ වේ. ඊට අමතරව කයිට්ස් බලකොටුව, අච්චුවේලි පල්ලිය, කන්සන්තුරේ ප්‍රදීපාගාරය, යාපනය පැරණි කච්චේරිය, සක්කෝට්ටෙයි, මන්නාරම කොටුව, ඩෙල්ෆ් දූපත ආදී ස්ථානයන්හි සංරක්ෂණ කටයුතු සහ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.





# උතුරු පළාතේ මූලික ගවේෂණ තවදුරටත්..

වසර 30 යුද්ධයකින් පසුව උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන වාර්තාගත කිරීමේ මූලික ගවේෂණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් 2010 වසරේ ආරම්භ කරන ලදී. මෙම ගවේෂණය සඳහා අාපදා කළමණාකරණ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය විසින් "ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාත්මක උරුමය වාර්තාගත කිරීමට යටතේ" ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන ඉවහල් විය. විශේෂයෙන් උතුරු පළාතේ විස්තරාත්මක පුරාවිද්‍යා ගවේෂණ සිදුකෙරෙනුයේ ඉතිහාසයේ පළමුවරටය.

උතුරු පළාතේ පුරාවිද්‍යා ගවේෂණ කටයුතුවලදී පුරාවිද්‍යා ස්ථාන 300කට අධික සංඛ්‍යාවක් මේ වන විට වාර්තා කර ඇති අතර, එම ස්ථාන දිස්ත්‍රික්ක පදනමින් මුලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන 116 ක්, මන්නාරම දිස්ත්‍රික්කයෙන් ස්ථාන 66 ක්, කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් ස්ථාන 34 ක්, වව්නියාව දිස්ත්‍රික්කයෙන් ස්ථාන 50 ක් හා යාපනය දිස්ත්‍රික්කයෙන් ස්ථාන 50 ක් ලෙස වාර්තා කර අවසන් කර ඇත. (මේ වන විට ස්ථාන 100කට අධික ප්‍රමාණයක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත.) මෙම හඳුනාගත් ස්ථානයන්ගෙන් බොහොමයක් පුරාවිද්‍යා වැදගත්කමක් සහිත ස්ථානයන් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර ඉන් කොටසක් සඳහා මායිම් කණු යොදා වෙන්කරන ලදී. මෙම ගවේෂණය උතුරු පළාත තුළ තවදුරටත් සිදුකරමින් පවතී.

මෙහිදී වසර සියයකට වඩා පැරණි සෑම ස්ථානයක් වාර්තාගත කිරීමට බඳුන් විය. එහිදී හඳුනාගත් පුරාවිද්‍යා වැදගත්කමක් සහිත ස්ථානයන් අතරින් අති බහුතරයක් බෞද්ධ නටබුන් ලෙස හැඳින්විය හැක. තවද ප්‍රාග් ඓතිහාසික ජනාවාස සාධක මෙන්ම පැරණි වැව් අමුණු, පැරණි කෝවිල්, පල්ලි මෙන්ම වෙනත් ගොඩනැඟිලි නටබුන් ද මේ අතර විය. මෙහිදී හඳුනාගත් පුරාවිද්‍යා ස්ථානයන්ගෙන් අති බහුතරයක් අනුරාධපුර අවධිය නියෝජනය කරයි.

ගවේෂණයේදී මන්නාරම දිස්ත්‍රික්කයෙන් හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන අනුලා "මන්නාරම දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා උරුමය" මැයින් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදී. මෙම ගවේෂණ සඳහා සහ ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහාත් ආරක්ෂක හමුදාව ලබාදුන් සහාය අතිමහත්ය.

✍ එම්.වී.පී. කල්ප අසංග
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර,
ප්‍රධාන කාර්යාලය.

# පතහවත්ත පැරණි පොකුණ සංරක්ෂණය අවසන් අදියරේ...!

කෑගල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රඹගම නම් ගමේ පිහිටි පුෂ්කරාරාම විහාරය පතහවත්ත නමින් ද හඳුන්වයි. එයට හේතුව එහි ඇති කළුගල් ගලින් බඳින ලද පැරණි පොකුණයි. ක්‍රි.ව. 14 - 15 සියවස්හි රයිගම රාජධානිය විචාල රයිගම බණ්ඩාර නම් ප්‍රාදේශීය පාලකයෙකු වාසය කළ මාලිගය පිහිටි භූමි භාගය ලෙස මේ පතහවත්ත සැලකේ. ප්‍රමාණයෙන් අක්කර

4 ꞏ X පමණ වූ මෙම භූමි ප්‍රදේශය කළුගල් ගලින් කළ ප්‍රාකාරයකින් වට වී ඇත. එමෙන් ම රයිගම බණ්ඩාර විසින් භාවිත කළායි සැලකෙන කළුගල් ගලෙන් නිර්මාණය කරන ලද පොකුණ ද සුවිශේෂී වේ. පොකුණෙහි දිග අඩි 110 ද පළල අඩි 65 ද වෙයි.

රාජකීයන් දියනෑමට භාවිතා කළ විශාල පොකුණ හෙවත් පතහ වල් බිහි වී බොහෝ විනාශයට පත් වී තිබූ ස්මාරකයකි. එබැවින් අපගේ සංරක්ෂණ ක්‍රියාදාමයන් පෙළගැස්වා ගැනීම බොහෝ අසීරු කාර්යයක් විය. ඊට හේතුව වූයේ පොකුණෙහි ජලය පිරී තිබීමයි. පළමුව පොකුණේ ජල මට්ටම අඩුකර පතුලට වැඩි කොට්ට දමා සකස් කර ගැනීමට සිදු විය.

සංරක්ෂණ සැලසුම් හා වාස්තු විද්‍යා උපදෙස් මත පොකුණෙහි එක් පැත්තක පොකුණු ඉවුරෙහි පෙරළී තිබූ කළුගල් සියල්ලම උඩට ගෙන පසෙකින් අසුරා තැබීම කරන ලද අතර, පසුව වල් බිහිවී තිබූ කොටස් ශුද්ධ කර ලබාදුන් උපදෙස් අනුව පස් කට්ටු ඉවත් කරමින් කළුගල් ගල් වරි පාදාගැනීමට සිදු වූ අතර කුඩා කළුගල් කැලි කළුගල් වරිවල ඉතිරි වී ඇති බව දක්නට ලැබුණ බැවින් ඒවා සියල්ලම ගලවා ඉවත් කරන ලදි. මෙහිදී දක්නට ලැබුණේ පොකුණේ කළුගල් ගල්වරි රඳා සිටීමට අඟල් 17 පමණ ඝණකම කුඹුක් ලෑල්ලක් අත්තිවාරම ලෙස යොදා ඇති බවයි. මෙය මරසිලිටුව හා ඉතා ශක්තිමත් භාවයෙන් පැවතීම නිසා එකල පැවති තාක්ෂණ දියුණුව මනාව පිළිබිඹු වේ. අපගේ සංරක්ෂණයේදී ලී කොටය මත පැරණි කළුගල් ගල්වරිය එසේම තැබීමට සලස්වා අනෙක් ගල් වරියේ සිට සංරක්ෂණ වැඩ ආරම්භ කිරීම කරන ලදී. පොකුණෙහි පැරණි කළුගල් ගල්වරි යොදා තිබූ සැලැස්මට අනුව අදාළ පැත්තුම් එනම් අඟල් 3 සිට 4 ප්‍රමාණයක් සහිතව 18, ෲ 12, ෲ 7, කළුගල් ගල් භාවිතා කර ඇතුලට තබා පැරණි තිබූ ආකාරයට සකස් කරන ලද අතර, වාස්තු විද්‍යා උපදෙස් අනුව බඩගල් දෙකකට එක් මුහුගලක් සිටින සේ තබා වරියෙන් වරිය පොකුණ වටාම එක් මට්ටමකට එනම් කළුගල් වරි 5 ක් පමණ සිටින සේ බැඳීම කරන ලදී.

සංරක්ෂණ සැලැස්ම හා ලබාදුන් උපදෙස් අනුව පැරණි තිබූ ආකාරයටම බඳින ලද බැම්මෙහි සම්පූර්ණ කළුගල්ගල් වරි ගණන 22 කි. පතන සිට ඉහලට බඳින ලද ගල් වරි 16 කින් පසු මෝල්ඩින් ආකාරයට සකස් කල අඟල් 22 දිග විශේෂිත වූ කළුගල් ගලකි. පොකුණෙහි අවසාන ගල් වරිය සඳහා දෙපසම මෝල්ඩින් කරන ලද කළුගල් ගලකින් සංරක්ෂණ වැඩ අවසන් කර ඇත. මෙම පොකුණ හෙවත් පතහ අනුරාධපුරයේ කුට්ටම් පොකුණෙහි ආකෘතියට සමානව නිමවීම ගැන විද්වතුන්ගේ පැසසුමට ලක් ව ඇති අතර, ලංකාවේ දැනට දැකිය හැකි විශේෂිත වූ ස්මාරකයකි. දැනට පොකුණ වටා උද්‍යාන අලංකරණ කටයුතු සිදුකරමින් පවතී.





✍ සුභාෂිණී චන්ද්‍රසෝම
කාර්මික නිලධාරී
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය (බස්නාහිර පළාත)

# නිර්මාණ පිටුව

## ඔරලෝසුව



පිටින් කැරකී
ලොවට පෙනුනට........
ඇත්ත දන්නේ
කවුද හරියට...
වටේ කැරකෙන
කට්ට පෙනුමට.......
උනු මහන්සිය
දන්නෙ දැති ටික....

## අපි තාම මග





මදැයි පාර බලන් හිටියා.....
ආච්චි එහකල්
ගාලු යන්න.....
මෙන්න ආච්චිගෙන්
එස් එම් එස් එකක්...
පුතේ මම හයිවේ එකේ...
දැන් ගාල්ලට කිට්ටුයි......

## සත්‍යය



කර්මයක් වේනම්
පලදෙන්න සසරේ
විදුලි එළි රැගෙන එයි
සැඟවුනත් අඳුරේ



## දේවදත්තයින්

සුණු විසුණු කර
දමා දාගැබ් පිළිම
හා තව පොළව හාරයි
පෙරළුවාටත් වැඩිය
ගල්කුළු
බුදුන් යළි ලොව පහළ වේ නම්
නසයි පණ මුන්
උපන් ගෙයිදීම

ඒ. ඇම්. විජේපාල
පුරාවිද්‍යා කෞතුකාගාරය
දඹදෙණිය.



## ඇත්ත දෙබසක්

- ආච්චි අම්මෙ,
  අනේ පුතේ
  කැලේ මැද
  පිහිය අමතකවුනා.....
  හොයාන එරෙන්.....

- මුණුපුරා,
  හිනස්සවන්න එපා
  ආච්චි අම්මෙ.....
  ඒ කැලේ පිහියක් තියා
  අලියෙක් නැති උනත්
  හොයන්න බැරිවු...




## දෝංකාරය

අපි හූ කියනකොට
අපිට හූ කියන
අපිට නොපෙනෙන
අපේ ඇත්ත

කාව්‍ය නිර්මාණ
**එච් එම් එස් කේ ඇරැවගම,**
සිතුවම් නිර්මාණය
**සමන් කළුබෝවිල**

# හරස් පද ප්‍රහේලිකාව



**හරහට**

1. ස්තූපයක හතරැස් කොටුව
4. මල වසයි.
6. පැරණි සරෝගාමය.
8. දඩයම්ට මෙන් ම අතීත යුධයට ද එකසේ වැදගත් වූවකි.
9. ස්තම්භාකාර මන්දිරය.
11. කුරුසාව මෙනමින් ද හැඳින් වේ.
12. ශක්තිය.
14. යකඩ යන අරුත ගැන් වේ.
15. හැට්ත්ත යනු මෙයටම නමකි.
18. රන් කඩුව.
19. අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ශක්ති මේ නමිනි.
21. සිහනව.
23. මැටිමුවා නිර්මාණ.
25. ප්‍රතිමා ශිල්පීන් ගේ මිණුම් දණ්ඩ බස්වහරේ දී මේ නමින් හැඳින් වේ.
26. රජතුමාගේ ඇතුන් පිළිබඳ කාර්යාංශය.

**පහළට**

1. දෙවන පෑතිස් රජු ඇසා ගේ ඇල්ම ඇති තැන කරවූ විහාරය.
2. වඩා උස් නොවූ.
3. වැව යන අරුත් ගැන් වේ.
4. සංඝයාට දුන් බව හැඟවේ.
5. පූජාට පඬිවරයෙකි.
7. රසවත් කෑමකි.
9. පරාලයක, රීප්පයක හෝ ආරුක්කුවක මෙම කණ යෙදේ.
10. සිංහල දෙල් මේ නමින් හැඳින් වේ.
11. සේනාංකයක ප්‍රධානියා මෙනමින් හැඳින්වේ.
12. යෝධ ඇළ
13. කවි විශේෂයකි.
16. පෙර දවස රජුගේ ආදායම් එකතු කරන්නා.
17. දුටුගැමුණු රජු ගේ ජය කුන්තය වට කොට කළා යැයි සැළකෙන චෛත්‍යය.
20. අකුසල මූලයකි.
22. සත්ව ලොව වේගවත් ධාවකයෙකි.
24. පුරාවස්තු කසන්නාට මෙය ලබා නොදේ.

හරස් පද ප්‍රහේලිකාව සකසා අප වෙත එව්වේ, අයි.ඩී.එම්. විජේබණ්ඩාර, පුරාවිද්‍යා පර්යේෂණ සහකාර, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, මහනුවර.

## අතීත නිමැවුම

රත්සරනින් විදියෙන්
මුතු මැණිකෙන්
ගලින් යකඩින්....
ඇත්දළින් මැටියෙන්
පබළුන් හෝ පිත්තලෙන්...
ලීයෙන් සෝමනයෙන්
සැරසුණු ඔබ
සිතුමැලිය......
වංචලය......
නිශ්චලය.....
අම්ලය.

✍ අයි.ඩී.එම්. විජේබණ්ඩාර

## විශ්‍රාමික පුරාවිද්‍යා සංරක්ෂණ ශිල්පියෙකුගේ කවි සිතුවිලි

කාරා අවුරුදු ඉතිහාසය සතු
අභිමානය සිය දුහි පරපුරට මිතු
යොමු වී තිබේ අද විනාශනේ හොතු
මෙත් සැර අවදිවව් දැක උරුමයක සතු

අතීත විරු දුක්කම් සැළින දැක
නිවැරදි දැනුම වත්මන් පරපුරට දෙන
සුරත් පරපුරට සුරැකිව උරුම වන
පුදුමෙම් සැමට සේවයේ නිරත වන

ආගම් දහම් සමගින්
සතුටින් සිතේ ඇල්මෙන්
උරුමයන් රකිමින්
කලේ සේවය ලැබිම පණ මෙන්

✍ ගාමිණී උඩකන්දගේ
විශ්‍රාමික සංරක්ෂණ සහකාර

## දැයේ දරුවනේ අපි සුරකිමු උරුමය

මියැදුණ අතීත දු පුතුන්
දායාද කොට දුනිමු
නිමවුම් සංකල්පනා
අනාගතය ජයගන්න ගෙයි කියා

වත්මනේ අපේ නිමැවුම් ද සංකල්පනා
එක් වේවි යම් දිනක අතීතයට

දැයේ දරුවනේ අපි
සුරකිමු උරුමය
අනාගත දරු පරපුරට...

✍ ඩී. කුසුම්ලතා ආරියසිංහ
සංවර්ධන නිලධාරී, අරණායක.

## මිරිවැඩි සඟල



නිවන් පතමින්
බුදුගෙට ගිය
මා දමා..................
දොරකඩ සිටි නුඹ
වටත් හොරෙන්
හත් උනේ මන්ද........?

# අවුරුදු 3,000 පැරණි ළදරු ඇටසැකිල්ලක්

අවුරුදු 3000 පැරණි වූ ළදරු ඇටසැකිල්ලක් අයර්ලන්තයෙන් හමු වී ඇත. මෙය සොයාගෙන ඇත්තේ අයර්ලන්තයේ *Tiachtga* හි කැණීම් වලිනි. හොඳින් ආරක්‍ෂා වී ඇති මෙය අංග සම්පූර්ණ ඇට සැකිල්ලක් වන අතර නිසැකවම වයස මාස 07-10 අතර දරුවකුගේ බව නිශ්චය කර තිබේ. සති තුනක පමණ කාලයක් තුළ සිදුකළ කැණීම් වලදී අනාවරණය කරගනු ලැබූ මෙය *Tiachtga* වල ඇති තවත් තේරුම් ගත නොහැකි හමුවීමක් ලෙස පුරාවිද්‍යාඥයින් සලකයි. මන්ද *Tiachtga* යනු අයර්ලන්තයෙන් හඳුනාගත් එවැනි අර්ථකථනය කිරීමට දුෂ්කර ගුප්ත කැණීම් ස්ථාන අතරින් එකකි.

මධ්‍යකාලීන ලිපි වලින් දැක්වෙන පරිදි මෙම ස්ථානය *Samhain* ඇදහිලි හා සම්බන්ධ බව විද්වතුන්ගේ අදහසයි. *Samhain* යනු ඉපැරණි කෙල්ටික් ගෝත්‍රිකයන් ගේ උත්සවයකි. එය නූතන හැලොවීන් *(Haloweem)* සැමරුමේ ප්‍රාථමික අවධිය ලෙස දැක්වෙයි.

ඒ අනුව මෙම ඇටසැකිල්ල අභිචාර විධීන් හා සම්බන්ද ක්‍රියාකාරකම්ක ප්‍රතිඵලයක් ලෙසට පුරාවිද්‍යාඥයන් අනුමාන කරයි. මෙම ළදරු මරණයට හේතුවිය හැකි සාධක තවමත් සොයාගෙන නොමැති වුවද ඇටසැකිල්ල නිශ්චිතවම වසර 3000 තරම් ඉපැරණි බව මෙම කැණීමේහි ප්‍රධාන පුරාවිද්‍යාඥ ස්ටෙෆන් ඩේවිස් විසින් පවසා තිබේ. කැණීම් කරන ස්ථානයේ මීටර් 1.5 පමණ යට පිහිටි පහළම ස්තරයෙන් හමු වූ මෙම දරුවාගේ ඇටසැකිල්ල තවමත් අභිරහසකි.



*Tiachtga* හි කැණීම් සඳහා ගුවනේ සිට ලේසර් කිරණ *(Air Bone aser)* සිදුකළ හැකි පුරස්ථ සංවේදිය තුම යොදාගෙන තිබේ. ඒ අනුව මේ දක්වා සිදු කළ කැණීම් මඟින් 1000 *BC* තරම් ඈතට දිවෙන වාර්තා වීථි හා සම්බන්ධ විවිධ පුරාවිද්‍යා මූලාශ්‍ර රැසක් අනාවරණය කරගැනීමට හැකි වී ඇත.

# පැරණි චන්ද්‍රිකා ඡායාරූප මගින් සැඟවුණු නගර අනාවරණය කර ගනියි

සිරියාවේ බටහිර ප්‍රදේශයේ පැරණි චන්ද්‍රිකා ඡායාරූප සමූහයක් නැවත අධ්‍යයනය කිරීමෙන් මෙතෙක් අනාවරණය කරගැනීමට නොහැකිව තිබූ පැරණි ශිෂ්ටාචාරයක සාධක හඳුනාගෙන තිබේයි. සිරියානු පුරාවිද්‍යාවට මෙතෙක් රහසක්ව පැවති මෙම පැරණි නගරයේ ඇති වීදි, ඇළ මාර්ග ආදිය ද මෙමගින් අනාවරණය කරගෙන ඇත.

1962-1979 සීතල යුධ සමයේ (Cold war) සෝවියට් මිසයිල මධ්‍යස්ථාන සහ හමුද මූලස්ථාන හඳුනා ගැනීම සඳහා කොරෝනා (corona) නමින් හැඳින්වූ ඇමරිකානු රහස් ඔත්තු සංවිධානය භාවිත කළ චන්ද්‍රිකා ඡායාරූප නැවත අධ්‍යයනය කිරීමෙන් මෙම සොයාගැනීම සිදු කරනු ලැබ ඇත්තේ Arkansas විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පර්යේෂණ කණ්ඩායමක් විසිනි.

1960 දශකයේ දී ලබාගෙන ඇති 188,000 පමණ වූ ප්‍රමාණයෙන් විශාල මෙම ඡායාරූප වර්තමාන චන්ද්‍රිකා ඡායාරූප හා සාපේක්ෂව තීව්‍රතාවයෙන් මඳ වුව ද නූතන ඉදිකිරීම් සිදු කිරීමට පූර්වයෙන් ලබාගෙන ඇති බැවින් පැරණි ශිෂ්ටාචාරයේ ශේෂිත සලකුණු මනාව ඒවායෙහි සටහන්ව තිබී ඇත. Arkansas විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාඥ Jesse Casana පවසන පරිදි, සිරියාව සහ තුර්කියට අයත් ලෝකඩ යුගයට අයත් නගර මෙමගින් ඔවුන්ට හඳුනාගැනීමට හැකි වී ඇත. ඒවායෙහි ප්‍රාකාර බැමි මනාව දර්ශනය වෙයි. ඔහුට අනුව අක්කර 123 කට අධික ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව තිබී ඇති ලෝකඩ යුගයේ නගර දෙකක සාධක මෙමගින් හඳුනාගෙන ඇත.

මීට අමතරව මෙම චන්ද්‍රිකා ඡායාරූප අධ්‍යයනයෙන් මැද පෙරදිග කලාපයේ මෙතෙක් හඳුනාගෙන නොමැති වෙනත් නූදෙකලා පුරාවිද්‍යා ස්ථාන 10,000කට අධික සංඛ්‍යාවක් මේ වනවිට අනාවරණය කරගැනීමට මෙම පර්යේෂණ කණ්ඩායම සමත් ව ඇත.

ඇමරිකානු Corona රහස් ඔත්තු සංවිධානය 1960 දශකයේ දී අප්‍රිකාවේ සහ චීනයේ තොරතුරු සොයාබැලීම සඳහා යොදාගත් චන්ද්‍රිකා ඡායාරූප ද වැඩිදුර අධ්‍යයනය කරමින් එම ප්‍රදේශවල ද පුරාවිද්‍යා ගවේෂණ කටයුතු සිදු කිරීමට නුදුරේ දී ම තමන් බලාපොරොත්තු වන බව පුරාවිද්‍යාඥ Jesse Casana වැඩිදුරටත් පැවසීය.

# ගිලී ගිය පැරණි නැවකින් ටැබ්ලට් පරිගණකයක් සොයා ගැනේ.

වර්තමාන ටැබ්ලට් පරිගණකයට සමාන උපකරණයක් තුර්කියේ කැණීමකින් හමුව ඇත. තුර්කියේ බොස්පොරස් හි පැරණි වරායක සිදුකරමින් තිබූ කැණීමක දී හමු වූ වසර 1200 ක් පමණ පැරණි දැවමය උපකරණයක් පිළිබඳ මෙම මතය පළව තිබේයි.

ඉස්තාන්බුල්හි යෙනිකැපි *(Yenikapi)* ප්‍රදේශයේ වැලලී ඇති 37 ක් වූ පැරණි නැව් අතරින් එක් නැවක අවශේෂ සමඟ තිබී මෙම සොයාගැනීම සිදුකර ඇත. මෙම විශේෂ උපකරණය, එය හමුව ඇති පුරාවිද්‍යා සන්දර්භයට අනුව බොහෝ විට නැවෙහි කපිතාන්ට අයත්ව තිබූවක් බව පුරාවිද්‍යාඥයින් අනුමාන කරයි. එය පහසුවෙන් අතෙහි රැගෙන යා හැකි පෙට්ටියකි.

මෙහි පිටත වැස්ම සියුම් දැව කැටයම්වලින් නිර්මිතය. වර්තමාන අඟල් 7 ටැබ්ලට් පරිගණකයක දිග පළලින් යුතු වූ මෙය කහනමින් සාපේක්ෂව තරමක් විශාලය. එය එක මත එක තැබූ සාපුකෝණාස්‍රාකාර රාමු කරන ලද පැනෙලයක් 5 කින් සමන්විතය. ඒවා ඇතුළත වැක්ස් *(wax)* ආලේප කරන ලද සමතල පෘෂ්ඨයන්ගෙන් සමන්විතය. මෙම පැනලවල පෘෂ්ඨයේ වැක්ස් මත අක්ෂරවලින් සටහන් *(notes)* තබා ඇත. පැරණි ග්‍රීක අක්ෂරවලින් තැබූ එවැනි සටහන් එහි දැනුදු ශේෂිතව ඇත. පහළම පැනලය දැවය තුළ හාරා කසස් කර ඇති කුට්ටවලින් සමන්විතය. අවශ්‍ය විටෙක චලනය කළ හැකි ලෙස සකස් කර ඇති මෙම පැනලය වර්තමාන ටැබ්ලට් පරිගණකයක 'app' ක්‍රමවේදයට බොහෝ සෝ සමාන වනු ඇතිබව මේ පිළිබඳ පර්යේෂණ කරනු ලබන Yenikapi Shipwrecks ව්‍යාපෘතියේ සහ ඉස්තාන්බුල් වි.වි. මුහුදු පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ අධ්‍යක්ෂ උෆුක් කොකැබස් *(Ufuk Kocabas)* පවසයි.

ඔවුන් විසින් කැණීම් සිදු කරනු ලබන පැරණි වරාය 4 වැනි සියවසෙහි *Byzantine* හි *Theodosius I* විසින් ඉදිකරන ලද වරායකි. එය එවකට කලාපයේ ප්‍රධානතම වෙළඳ වරාය ලෙස ක්‍රියාත්මක වී ඇත. මෙම විශේෂිත



පුරාවස්තුව සමඟ හමු වූ අනෙකුත් සාධක අනුව කැණීම් සිදු කරනු ලබන මෙම නෞකාව *Crimea* හි සිට *Black sea* හරහා *Kersonesas* දක්වා ගමන් කිරීමට කටයුතු යොද තිබී ඇති බව අනාවරණය කරගනු ලැබ ඇත. කැණීම් කටයුතුවලින් පසුව මෙම ගිලීගිය නෞකාව නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ අදහසින් ඉස්තාන්බුල් වි.වි. පර්යේෂණ කණ්ඩායම කටයුතු කරනු ලබන අතර මෙවැනි විශේෂිත පුරාවස්තූන් තවදුරටත් ඉදිරියේ දී අනාවරණය කරගැනීමට හැකිවනු ඇති බව ඔවුන්ගේ විශ්වාසයයි.

# අරාබිකරයෙන් හමු වූ ශිලා මෙවලම් නූතන මානවයා පිළිබඳ නැවත කියවීමක් ද...?

නූතන මානවයා අප්‍රිකාවෙන්, පිටතට සංක්‍රමණය වී ලොව පුරා ව්‍යාප්ත වීම අවස්ථා කිහිපයක දී සිදු වී ඇති බවත්, එය මෙතෙක් අනුමාන කරනු ලැබ සිටි කාලයට වඩා බොහෝ පූර්ව කාලයක දී සිදුවන්නට ඇති බවත් නවතම සොයාගැනීම් අනුව පුරාවිද්‍යාඥයින් මත පලකරයි.

අරාබි කාන්තාර ප්‍රදේශයක මෑතක දී අනාවරණය කර ගනු ලැබූ අදින් වසර 10,000 පමණ පැරණි ශිලා මෙවලම් අධ්‍යයනයෙන් පසු මෙම නව අදහස මතුව තිබෙයි. මේ පිළිබඳ පර්යේෂණ කරන ජර්මනියේ ටියුබින්ගන් විශ්වවිද්‍යාලයේ පුරාමානවවිද්‍යාඥ සයිමන් හැරෙට් සහ ඇයගේ පර්යේෂණ කණ්ඩායමට අනුව මෙම විශේෂ තාක්ෂණයෙන් යුතු ශිලා මෙවලම් අප්‍රිකාවෙන් පිටත හමු වී ඇති ප්‍රථම අවස්ථාව මෙයයි.



නූතන මානවයා ලොව පුරා ව්‍යාප්ත වීම පිළිබඳ උපන්‍යායන් කිහිපයක් මේ වනවිට ඉදිරිපත් වී ඇති අතර, අප්‍රිකාවෙන් බැහැර කලාපීය උපන්‍යාය *(out of Africa theory)* වී අපරිමිත විවාදයට තුඩු දී ඇති ප්‍රදානතම මතයයි. දැනට හමු වී ඇති මානව පොසිල සාධක සහ ශිලා මෙවලම් අනුව නූතන මානවයා අප්‍රිකාවෙන් නික්ම යෑම අදින් වසර 70,000 කට පමණ ඉහත දී සිදු වී ඇත. නමුත් මේ ආකාරයේ ශිලා මෙවලම් *(10,000B)* අප්‍රිකාවෙන් පිටත ප්‍රථම වතාවට මෙසේ හමුවීමත් සමගම නූතන මානවයා අප්‍රිකාවෙන් නික්ම යෑම පිළිබඳ මෙතෙක් පැවැති උපන්‍යායයන් විවාදයට බඳුන් වී ඇත.

මේ අනුව, හමු වී ඇති ශිලා මෙවලම් මගින් මෙතෙක් පැවති මත බිඳහෙළමින්, නූතන මානවයා අප්‍රිකාවෙන් නික්ම යෑම කිහිප වරක දී සිදු වූ බවත් ඉන් පළමු අදියර අදින් වසර 200,000දී පමණ අරාබි අර්ධද්වීපයේ වෙරළ තීරය ඔස්සේ හෝව ගොඩබිම් මාධ්‍යයෙන් සිදු වන්නට ඇති බවටත් ප්‍රමාණවත් සාධක සපයයි.



# ලක්සම්බර්ග් අධිරාජ්‍යයාගේ මිළ කළ නොහැකි සේද සළුව සොයා ගැනේ

පූජනීය රෝමානු අධිරාජයෙකු වූ vii වැනි ලක්සම්බර්ග් (1275-1313) රජුගේ සොහොන් ගැබෙන් තවත් වටිනා වස්තුවක් සොයා ගැනීමට හැකි වී තිබේ. ඒ ඉතා වටිනා සේද රෙද්දකි. ඔහුගේ හිසත්, අස්ථි ඇතුළු අනෙකුත් සුන්බුන් තැන්පත් කළ ගලින් තැනූ මිනී පෙට්ටිය තුළින් සොයාගත් මෙම අනර්ඝ සේද සළුව ඉතා වටිනා ගණයේ සේද පිළි බව හඳුනාගෙන ඇත. ඉතා විශාල වූ මෙම සේද රෙද්ද දිගු කාලයක් පුරා ඉතා හොඳින් ආරක්ෂා වී තිබීම පුදුම සහගත බව පුරාවිද්‍යාඥයින් පවසයි. ඔහුගේ ශරීර කොටස් මැනවින් ආරක්ෂා වන ලෙස ඉතා හොඳින් ඔතා පැකීමට මෙම වටිනා සේද රෙද්ද භාවිත කර තිබේ.







Pissa පල්ලියේ ඇති ඔහුගේ සොහොන් ගැබ තුළ තැන්පත් කර ඇති මිනී පෙට්ටිය තුළ බොහෝ වටිනා රාජ භාණ්ඩ රැසක් ද ඔහුගේ සිරුර සමග තැන්පත් කර තිබේ. ඒවා අතර රජුගේ සෙංකෝලය, රජ කිරුළ, කඩුව ආදිය හමු වී ඇත. මේවා සියල්ල රජුගේ ශරීර කොටස් දවටා තිබූ සේද සළුව මත තබා තිබිණි. මේ සියළු මිල කළ නොහැකි පුරාවිද්‍යාත්මකව වටිනා භාණ්ඩ පිළිබඳව ඉතාලි පුරාවිද්‍යාඥයින් තවදුරටත් තොරතුරු අධ්‍යයනය කරයි.



විදෙස් පුරාවිද්‍යා තොරතුරු සම්පාදනය
✍ අමල්කා විජේසූරිය
✍ හාගනා අත්තනායක



මහියංගණ ධාතු ගර්භයෙන් හමු වූ බිතුසිතුවම්

[illegible]

[illegible]


**උපදේශකත්වය හා අධීක්ෂණය**
ආචාර්ය සෙනරත් දිසානායක - පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක**
සුනිල් බණ්ඩාර කෝරළගේ

**විශේෂ සහාය**
ප්‍රසන්න රත්නායක - අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) අතිරේක අ.ජ. (ශාස්ත්‍රීය) වැ.බ.
දීපාල් විජේසිංහ - වැ.බ. අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
මහාචාර්ය මාලිංග අමරසිංහ
ගයත්‍රී කාංචනා කුමාරගේ

**කාටූන් නිර්මාණය**
සමිත් කළුබෝවිල



**ඔබේ අදහස් යෝජනා හා ලිපි ලේඛන**
සංස්කාරක
'දායාද' පුවත් පත,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07
යන ලිපිනයට යොමු කරන්න.

දුරකතන අංකය : 0112 - 688326
0112 - 692840 දිගුව 301


## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දුරකතන නාමාවලිය

| | |
|---|---|
| පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | - 011-2695255 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - 011-2683470 |
| නියෝජ්‍ය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | - 011-2696808 |
| අධ්‍යක්ෂ (පාලන) | - 011-2698604 |
| අධ්‍යක්ෂ (මුදල්) | - 011-2694728 |
| ගණකාධිකාරී | - 011-2667154 |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | - 011-2676449 |
| පරිපාලන නිලධාරී | - 011-2691985 |
| අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | - 011-2693216 |
| අධ්‍යක්ෂ (පොදු සේවා) | - 011-2688326 |
| අංශ ප්‍රධාන (රසායන අංශය) | - 011-2691960 |
| සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර) | - 011-2696808 |
| සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන) | - 011-2695609 |

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) | - 011-2696514 |
| සහකාර අධ්‍යක්ෂ (කැණීම්) | - 011-2692844 |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | - 011-2692842 |
| පුරාවස්තු විනාශය වැළැක්වීමේ විශේෂ ඒකකය | - 011-7222333 |
| විශේෂ පොලිස් ඒකකය | - 011-2694727 |
| | - 0112692840 |
| | දිගුව 509 / 510 |
| සිසි අංශය | - 011-2692843 |
| පොදු දුරකතනය | - 011-2692840-41 |

වෙබ් අඩවිය : www.archaeology.gov.lk


[illegible]